## **2022/01/11 දින පැවති මහාසභා රැස්වීම් වාර්තාව**

2022/01/11 දින පෙ.ව. 09.30 ට නාගොඩ ප්‍රදේශීය සභා රැස්වීම් ශාලාවේදී රැස්වීම පවත්වන ලදී.

**සහභාගී වූ**

| | | |
|---|---|---|
| 1. | නිමල් වික්ටර් නාගොඩවිතාන මහතා | ගරු සභාපති |
| 2. | එම්.කේ. ගාමිණී සුසන්ත මහතා | ගරු උප සභාපති |
| 3. | ඒ.එච්.වී. අජිත් කුමාර මහතා | ගරු මන්ත්‍රී |
| 4. | ඩබ්. ජී. නිශාන්ත මහතා | ගරු මන්ත්‍රී |
| 5. | සී.වී. සහබන්දු මහතා | ගරු මන්ත්‍රී |
| 6. | බන්දුල සමන්ත හිරිමුතුගොඩ | ගරු මන්ත්‍රී |
| 7. | එච්.ජී. තරංග සුදර්ශන මහතා | ගරු මන්ත්‍රී |
| 8. | කුමාරගේ වසන්ත මහතා | ගරු මන්ත්‍රී |
| 9. | එච්.කේ.ලක්රුවන් සම්පත් මහතා | ගරු මන්ත්‍රී |
| 10. | එන්.ජී. ගයාන් මධුෂංඛ මහතා | ගරු මන්ත්‍රී |
| 11. | ධර්මසිරි ගනේවත්ත මහතා | ගරු මන්ත්‍රී |
| 12. | පියල් හිරිමුතුගොඩ මහතා | ගරු මන්ත්‍රී |
| 13. | සුභාෂි මධුමාලි ඒකනායක මෙනවිය | ගරු මන්ත්‍රිනී |
| 14. | එඩේරආරච්චි වෙරංග ලක්මාල් මහතා | ගරු මන්ත්‍රී |
| 15. | නාපෙ විතානගේ සමන් මහතා | ගරු මන්ත්‍රී |
| 16. | සී. වනිගරත්න මහතා | ගරු මන්ත්‍රී |
| 17. | විලේගේ අමර ධනංජය මහතා | ගරු මන්ත්‍රී |
| 18. | ප්‍රියන්තා ගුණසේකර මහත්මිය | ගරු මන්ත්‍රිනී |
| 19. | එම්.එම්.දිසානායක මහතා | ගරු මන්ත්‍රී |
| 20. | එන්.ඩබ්. පතිනායක මහතා | ගරු මන්ත්‍රී |
| 21. | විජිත් වීරගුණරත්න සහබන්දු මහතා | ගරු මන්ත්‍රී |
| 22. | කේ.කේ.අයි.නෙරංජලී මහත්මිය | ගරු මන්ත්‍රිනී |
| 23. | කේ.ඒ.සී. දිල්රුක්ෂි මහත්මිය | ගරු මන්ත්‍රිනී |
| 24. | එච්.එච්. ගයන්ති කුමාරි මහත්මිය | ගරු මන්ත්‍රිනී |
| 25. | ඩබ්. කේ. නෙලී මහත්මිය | ගරු මන්ත්‍රිනී |
| 26. | කේ.එච්.එම්.නදීකා දර්ශනී මිය | ගරු මන්ත්‍රිනී |
| 27. | පී.ජී. රංජිත් ජයවීර මහතා | ගරු මන්ත්‍රී |

**01. ආගම සිහි කිරීම**

2022.01.11 දින මහා සභාව ආරම්භ කිරීමට පළමුව පැමිණ සිටි සියලු දෙනා තම තමන්ගේ ආගම සිහි කිරීමෙන් අනතුරුව මිය ගිය ඥාතීන් රණවිරුවන් සිහිපත් කර විනාඩියක නිශ්ශබ්දතාවයක් පළ කළේය.

**02. මූලාසනයේ පිළිගැනීමේ කතාව**

ගරු උපසභාපතිතුමා ඇතුළු සියලුම මන්ත්‍රීවරුන්ට හා මන්ත්‍රීවරියන්ට ලැබුවා වූ 2022 නව වර්ෂය සුභ නව වසරක් වේවායි ප්‍රාර්ථනා කරනවා. පළමුවෙන්ම තව අවුරුද්දක කාලයක් ප්‍රාදේශීය සභා ධූරකාලය දීර්ඝ කලා කියලා, අද මාධ්‍යයෙන් දැක්කා. මෙම අවස්ථාවට පැමිණි උප සභාපතිතුමා, මන්ත්‍රීතුමන්ලා, මන්ත්‍රීතුමියන්ලා ඇතුළු සමස්ත සභාවම ගෞරවයෙන් පිළිගනු ලබනවා. අදත් මැතිවරණ කොමසාරිස්තුමා ප්‍රකාශ කරල තිබුණා. එකදිගට මාස තුනක් සභාවට නොපැමිණීම, මන්ත්‍රී ධූරය අහිමි වීමට හේතුවක් කියලා. වෙලාවට සභාවට නොපැමිණීමත්, සභාවට නොපැමිණීම හා සමානයි. මොකද මන්ත්‍රීවරු වෙලාවට පැමිණීම සිදු කරන්න. කොහොම නමුත් මේ අවුරුදු තුන හතර කාලය තුළ සභාවේ යම් යම් අඩුපාඩු තිබුණා. නමුත් යම් වැඩ කොටසක් කළා කියලා කවුරුත් දන්නවා. නමුත් 2022 වර්ෂය තුළ මීට වසර දෙකකට කලින් තිබුන කොවිඩ් තත්වයෙන් යම්තාක් දුරකට රට මුදවාගෙන, රට යථා තත්ත්වයකට පත් කරගෙන යමින්, පාසල් ආරම්භ කරමින් හා සියල්ල පෙර සේ කටයුතු කරන රටක් ලෙස ලංකාව ඉදිරියෙන් ඉන්නවා. එන්නත් කරන වැඩසටහන තුන්වන මාත්‍රාව හෙට සිට දින 5ක් ලබා දෙනවා. ඒ අවස්ථාවේදී තේ පැන් සංග්‍රහ, ප්‍රචාරණ කටයුතු කරන්න කියලා වෛද්‍ය නිලධාරී කාර්යාලයෙන් අපෙන් ඉල්ලීම් කළා. අපි ඒ දේ කරනවා. මේ කොවිඩ් වසංගත තත්වය නිසා අපිට නිසියාකාරව යමක් කරන්න හැකියාව ලැබුණේ නැහැ.එ බැවින් ඉදිරියේදී සියලුම මන්ත්‍රීවරුන්ට සාධාරණයක් ඉටු කරමින්, යමක් කරන්න බලාපොරොත්තු වෙනවා. ඒ සඳහා සහයෝගය ලබා දෙන්න කියලා ඔබතුමාලගෙන් ඉල්ලනවා. ඒ වගේම අලුත්වත්ත ප්‍රදේශයේ සභාවට අයත් ප්‍රදේශයක තේ ශක්ති අරමුදලින් හෝල් එකක් හදනවා. ඒකට අද මුල්ගල තියෙනවා කියලා වනිගරත්න මන්ත්‍රීතුමා සහ අජිත් එඩේරආරච්චි මන්ත්‍රීතුමා පරක්කු වෙනවා කියලා සභාව දැනුවත් කළා. පොළ වෙන්දේසි වුනොත් වුනෙත් නැහැ. නමුත් අපි ඒ කටයුත්ත කරනවා. පොළේ ආදායම් තත්ත්වය ඉහළ නංවා ගෙන යමින්, අද දින සභා රැස්වීමට පැමිණි සියලු මන්ත්‍රී මණ්ඩලය ඉතා ගෞරවයෙන් පිළිගනිමින්, සභාවේ කටයුතු ආරම්භ කරනවා.

**(අ)01. 2021.12.14 දින පැවති මහ සභා වාර්තාවේ නිවැරදි කිරීම් ඇත්නම් ඒවා නිවැරදි කර වාර්තාව ස්ථිර කිරීම.**

**(අ)02. පසුගිය වාර්තාවේ යෝජනා සඳහා ඉදිරිපත් කර ඇති සංශෝධන ඉදිරිපත් කිරීම**

2021.12.14 දින පැවති මහා සභාවේ සභා වාර්තාව සභාව පිළිගතයුතු සත්‍ය වාර්තාවක් ලෙස ගරු මන්ත්‍රී ධර්මසිරි ගනේවත්ත මහතා විසින් යෝජනා කළ අතර ගරු මන්ත්‍රී ගයාන් මධුසංඛ මහතා විසින් ස්ථිර කිරීමෙන් අනතුරුව ඒකමතිකව සභා සම්මත විය.

**(ආ). සභාපතිතුමා විසින් කරනු ලබන විශේෂ නිවේදන**

**(ඇ). සන්දේශ පෙත්සම් පැමිණිලි ඉදිරිපත් කිරීම**

01. නාගොඩ ප්‍රාදේශීය සභා ව්‍යාපාරික ප්‍රජාව විසින් ප්‍රාදේශීය පාලනයේ දුර්වලතා පෙන්වා දීම සම්බන්ධ 2022.01.08 දිනැති ලිපිය සභාගත කරන ලදී.

02. තල්ගස්වල නගර වැසියෙක් විසින් අනවසර ඉදිකිරීමක් සම්බන්ධව 2022.01.07 දිනැති ලිපිය සභාගත කරන ලදී.

03. අතුරු මාර්ගයට නමක් තැබීම සම්බන්ධයෙන් ඩබ්.ඒ.කේ. ජේ. චන්ද්‍රලාල් මයා විසින් යොමු කරන ලද 2022.01.05 දිනැති ලිපිය සභා ගත කරන ලදී.

04. ගෙවතු වගා ආරම්භ කිරීම සම්බන්ධයෙන් ගා/මාපලගම සිරිසුනන්ද (නවෝදයා) ම.වි. විසින් යොමු කරන ලද 2021.11.12 දිනැති ලිපිය සභාගත කරන ලදී.

05. මහජන ක්‍රීඩාංගනය ලබා ගැනීම සඳහා අභිමන් මිතුරු සංසදය විසින් යොමු කරන ලද 2022.01.11 දිනැති ලිපිය සභාගත කරන ලදී.

06. හඩට ඉඩක් ව්‍යාපෘතියේ ප්‍රාදේශීය ඒකාබද්ධ සංවර්ධන සැළැස්ම සකස් කිරීම සම්බන්ධව 2022.01.06 දිනැති ලිපිය සභාගත කරන ලදී.

07. එච්.ඒ පද්මසිරි, විලමාවත, උඩලමත්ත විසින් ප්‍රාදේශීය සභාව මගින් ඉදිකල බෝක්කුවක් අවහිර වීම සම්බන්ධ 2021.12.02 දිනැති ලිපිය සභාගත කරන ලදී.

08. උනන්විටිය, ඉලේපෙරුම මාවත ගම්වාසින් විසින් 2021.12.19 දිනැතිව යොමු කරන ලද එච්.එල්.ඉලේපෙරුම මාවත උනන්විටිය යන ලිපිය සභාගත කරන ලදී.

09. ඩී.එන්. පී එකෝ පොලීතින් ප්‍රතිචක්‍රීකරණ මධ්‍යස්ථානය විසින් නාගොඩ ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුල පොලිතින් ප්ලාස්ටික් ප්‍රතිචක්‍රීකරණය ව්‍යාපෘතිය යනුවෙන් 2022.01.05 දිනැති ලිපිය සභාගත කරන ලදී.

**(ඈ). යථා පරිදි කල් දී ඇති ප්‍රශ්න**

**01. ගරු මන්ත්‍රී චන්ද්‍ර සහබන්දු මහතා විසින් ඉදිරිපත් කරන ලද කොම්පෝස්ට් පොහොර ආදායම් සම්බන්ධ ප්‍රශ්නයට පිළිතුරු ලෙස**

| **වර්ෂය** | **පොහොර ආදායම** |
|---|---|
| 2018 | රු. 81142.00 |
| 2019 | රු. 89112.00 |
| 2020 | රු. 75810.00 |
| 2021 | රු. 47934.00 |

**කසළ එකතු කිරීමේ ට්‍රැක්ටර් රථය සඳහා ඉන්ධන වියදම**

2021 ජනවාරි සිට ඔක්තෝම්බර් දක්වා

RA 8569 ඉන්ධන - ලීටර් 1360 වියදම - රු. 150960.00

RA 8570 ඉන්ධන - ලීටර් 621 වියදම- රු. 68931.00

**02. ගරු මන්ත්‍රී චන්ද්‍ර සහබන්දු මහතා විසින් ඉදිරිපත් කරන ලද වීථි පහන් තොරතුරු පිළිබඳ ප්‍රශ්නයට පිළිතුරු වශයෙන්**

| | | ප්‍රමාණය | මුදල |
|---|---|---|---|
| 2021 වර්ෂය සඳහා මිළදී ගත් බල්බ් ප්‍රමාණය | 1000 | රු. 600500.00 |
| 2021 වර්ෂය සඳහා මිළදී ගත් වයර් ප්‍රමාණය | වයර් කොයිල් 28 | රු. 87525.00 |
| 2021 වර්ෂය සඳහා මිළදී ගත් 2 pin holder | 310 | රු. 30900.00 |
| 2021 වර්ෂය සඳහා මිළදී ගත් සුවිච් ප්‍රමාණය | 280 | රු. 46800.00 |
| 2021 වර්ෂය සඳහා මිළදී ගත් tape ප්‍රමාණය | 40 | රු. 2700.00 |
| 2021 වර්ෂය සඳහා මිළදී ගත් line tap ප්‍රමාණය | 500 | රු. 101500.00 |

**(ඉ). යථා පරිදි කල් දී ඇති යෝජනා**

**(ඉ). 1. ගරු සභාපති නිමල් වික්ටර් නාගොඩවිතාන මහතා ඉදිරිපත් කරන පරිපාලන යෝජනා.**

01. 2022 වර්ෂයට උඩුගම, තල්ගස්වල හා උනන්විටිය සතිපොළවල් ටෙන්ඩර් කිරීම සිදු කරද, ටෙන්ඩරය සඳහා කිසිඳු අයදුම්කරුවකු ඉල්ලුම් නොකල බැවින්, මේ සඳහා ගනු ලබන ඉදිරි ක්‍රියාමාර්ග පිළිබඳව අදහස් හා යෝජනා ඉදිරිපත් කිරීමට යෝජනා කරමි.

**ගරු සභාපතිතුමා අදහස් දක්වමින්,**
පොළවල් තුනේ ටෙන්ඩර් ගන්න කවුරුත් ඉදිරිපත් වුනේ නැහැ.

**ගරු උප සභාපතිතුමා අදහස් දක්වමින්**
පොලවල්වලට වෙළෙන්දෝ අඩු නිසා කොහොමත් ඉදිරියේදී ඉදිරිපත් වෙන එකක් නැහැ.

**ගරු සභාපතිතුමා අදහස් දක්වමින්,**

අපේ සභාවෙන් ගියහම වෙළෙන්දෝ කන් කෙඳිරි ගානවා. රුපියල් සීයක් වගේ තමයි ගාන කියන්නේ. ඒ දේ කරන්නත් බැහැ. ලබන මාසේ සිට කඩ වෙන්කරලා, කඩයකට කී මනී (Key money) අරගන්නවා

**ගරු මන්ත්‍රී නිශාන්ත නන්දන මහතා අදහස් දක්වමින්,**

තල්ගස්වල පොලේ වෙළෙන්දන්ගේ තොරතුරු සම්බන්ධව ෆයිල් එකක් තිබුණා. උඩුගම පොලේ එහෙම ෆයිල් එකක් නැහැ. ඒකයි ප්‍රශ්න ඇතිවෙන්නෙ.

**ගරු මන්ත්‍රී වෙරංග ලක්මාල් මහතා**

ඒ වගේම කරවල, රෙදි, එළවළු දාන්න වෙන වෙනම ස්ථාන වෙන් කරන්න ඕන.

**ගරු උප සභාපතිතුමා අදහස් දක්වමින්,**

ජනවාරි පෙබරවාරි කියන්නේ පොල අල්ලන කාලේ. මොකද අප්‍රේල් අවුරුද්දට දැන්ම ඉඳලා ලෑස්ති වෙනවා.

පොළ කරපු පුද්ගලයන් කැඳවාගෙන, ඔහුගෙන් තොරතුරු ලබාගෙන, කල් ඉඳලා ඉන්න වෙළෙන්දන්ට (ඉදිරිපෙළ) අසාධාරණයක් නොවන පරිදි කඩ බෙදීම සිදු කරන්න.

පොලවල්වලට ආදායම් පරීක්ෂක මහතා දෙක තුන වන විටත් සල්ලි එකතු කරන්න ගිහිල්ලා තිබුණෙ නැහැ. කාගෙන්හරි ඇහුවම මට කිව්වා. නඩුවකට ගිහිල්ලා කියලා. මෙහෙම වෙනකොට දවල් 12ට කලින් වෙළදාම් කරන මිනිස්සුන්ගෙ සල්ලි ගන්නෙ කොහොමද? උදේ 8.00 9.00 වෙනකොට පොලී සල්ලි එකතු කරන්න යන්න ඕන.

**ගරු මන්ත්‍රී නිශාන්ත නන්දන මහතා**

පොඩි ඔෆිස් රූම් එකක් හරි හදලා, දවසෙම රැදී සිටිමින් හරි, ඒ සල්ලි එකතු කර ගැනීම කළ යුතුයි. මොකද අවශ්‍ය ආදායම් නොලැබෙන කොට, අපට අවශ්‍ය ඉලක්ක කරා යන්න නොහැකි වනවා.

**ගරු සභාපතිතුමා විසින් ඉදිරිපත් කරන ලද ඉහත සඳහන් යෝජනාව ගරු මන්ත්‍රී විජිත් සහබන්දු මහතා විසින් ස්ථිර කරනු ලදුව ඒකමතිකව සභා සම්මත විය.**

**06. ඉදිරි ගෙවීම් වාර්තාව ඉදිරිපත් කිරීම**

**අංක 01 සිට 33 දක්වා ගෙවීම් සහා අරමුදල් මගින් ගෙවීම සුදුසු බව යෝජනා කරමි.**

**<u>2022.01.11 දින පවත්වනු ලබන මහසභා රැස්වීම සඳහා ඉදිරිපත් කළ යුතු ඉදිරි ගෙවීම් වාර්තාව.</u>**

**<u>01.2021 දෙසැම්බර් මස පරිවර්තිත ගමන් වියදම් ගෙවීම (ක්ෂේත්‍ර නිලධාරින් සඳහා)</u>**

| | | |
|---|---|---|
| ඩබ්.ජේ.ඒ.ශානක මයා | - ආදායම් පරීක්ෂක | -රු . 4000.00 |
| මානෙල් සුදර්ශනී මිය | - සංවර්ධන නිලධාරී | - රු. 6200.00 |
| කේ.ඒ.එදිරිසිංහ මයා | - තාක්ෂණ සේවා නිලධාරී | -රු . 5500.00 |
| නදුන් ප්‍රමෝද් මයා | - තාක්ෂණ සේවා නිලධාරී | -රු . 5500.00 |
| අනුෂා සමරවික්‍රම මෙය | - තාක්ෂණ සේවා නිලධාරී | -රු . 3000.00 |

**<u>02.2022 ජනවාරි මස ගමන් වියදම්</u>**
**<u>ආයතනයේ රාජකාරි ගමන්වල නියලීම වෙනුවෙන්</u>**

| | | |
|---|---|---|
| ඩබ්.ජේ.ඒ.ශානක | - ආදායම් පරීක්ෂක | - රු. 1070.00 |
| කේ.කේ.අවන්ත පද්ම මයා | - කාර්යාල කාර්ය සහායක | - රු. 560.00 |

**<u>2021 දෙසැම්බර් මස ගමන් වියදම්</u>**
**<u>ආයතනයේ රාජකාරි ගමන්වල නියලීම වෙනුවෙන්</u>**

| | | |
|---|---|---|
| නිමල් වික්ටර් නාගොඩවිතාන මයා | - සභාපති | - රු. 3000.00 |
| කේ.ඩී.එස්.නිපුනිකා මිය | - සංවර්ධන නිලධාරී | - රු. 510.00 |
| කේ.කේ.අවන්ත පද්ම මයා | - කාර්යාල කාර්ය සහායක | - රු. 560.00 |
| එම්. ඒ වසන්ත මයා | - රියදුරු | - රු. 7700.00 |
| කේ.එච්.එම්. කැළුම් චාමර මයා | - රියදුරු | - රු. 700.00 |

**<u>03. අතිකාල දීමනා ගෙවීම්</u>**
**<u>2021 දෙසැම්බර් මස</u>**

| | | |
|---|---|---|
| එම්.ඒ.වසන්ත මයා | - රියදුරු | - රු. 9136.00 |
| ඩී.ටී.ආර්.ඒ. ගුණරත්න මයා | - මුරකරු | - රු. 4708.00 |
| ඩබ්.කේ. සම්පත් සංජීව මයා | - අනියම් රියදුරු | - රු. 8560.00 |

| | | |
|---|---|---|
| යසරත්න විජේසේකර මයා | - මුරකරු | - රු. 8337.00 |
| කේ. එච්. එම්. කැළුම් චාමර මයා | - අනියම් රියදුරු | - රු. 8560.00 |
| එන්.එම්.රජිත් මයා | - අනියම් මුරකරු | - රු. 4747.00 |
| එස්.ඩී.එම්.කැටිපෙආරච්චි මයා | - විදුලි කාර්මික | - රු. 2100.00 |
| කේ.එම්.එම්.නිශාන්ත ඉදුනිල් මයා | - රියදුරු | - රු. 8560.00 |
| එම්.ඩබ්.හර්ෂ කුමාර මයා | - සෞඛ්‍ය කම්කරු | - රු. 4387.00 |
| ජ්.එච්.ජී. සංජීව මයා | - වැඩ/ක්ෂේත්‍ර කම්කරු (මුර සේවයේ යෙදීම වෙනුවෙන්) | - රු. 6781.00 |
| ඩබ්.ජී.දයානන්ද | - සෞඛ්‍ය කම්කරු | - රු. 3488.00 |
| හර්ෂචාමර සම්පත් | - සෞඛ්‍ය කම්කරු | - රු. 1515.00 |
| රංජිත් උදය කුමාර | - සෞඛ්‍ය කම්කරු | - රු.4050.00 |

**04. සභාපති, නාගොඩ ප්‍රාදේශීය සභාව**

i. 2021 දෙසැම්බර් මස මන්ත්‍රීවරුන් සඳහා ඉන්ධන ලබා ගැනීමේ බිල්පත - රු.81000.00
ii. සභාපතිතුමාගේ රාජකාරි අවශ්‍යතාවයන් සඳහා PF 7360 කැබ් රථය අධිවේගී මාර්ගයේ ගමන් කිරීම වෙනුවෙන් බිල්පත් මුදල් ගෙවීම් - රු. 1550.00
iii. 2021.12.30 දින නාගොඩ ප්‍රාදේශීය සභා ප්‍රධාන කාර්යාලයේදී පවත්වන ලද තාක්ෂණික ඇගයීම් කමිටුවේ සාමාජිකයින් වෙත දීමනා ගෙවීම - රු. 3500.00
iv. සුලු මුදල් අත්තිකාරම් මුදල් පියවීම - රු. 5000.00
v. සංග්‍රහ මුදල් අත්තිකාරම් ලබා ගැනීම - රු. 4000.00

**05. එම්.ජ්.ඩිලානි චන්ද්‍රප්‍රභා මිය,**

රාජ්‍ය සේවා කොමිෂන් සභා ලේකම්ගේ අංක sp/psc/07/01/08(76) හා 2021.05.17 දිනැති ලිපිය අනුව ලේකම් තනතුරෙහි වැඩ බැලීම වෙනුවෙන් දීමනා ගෙවීම - 2021 දෙසැම්බර් - රු.10395.00

**06. ලංකා පිලිං ස්ටේෂන්, ගා/නාගොඩ**

**<u>2021 දෙසැම්බර් මස ඉන්ධන ලබා ගැනීමේ බිලපත්</u>**

| | |
|---|---|
| PF 7360 කැබ්රථය ඩීසල් ලීටර් 599 ක් | - රු. 68219.00 |
| LL 7650 කෘ කැබ් රථය ඩීසල් ලීටර් 376 ක් | - රු. 43036.00 |
| LL 7366 ජල බවුසරය ඩීසල් ලීටර් 100 ක් | - රු. 11600.00 |
| RA 8570 ට්‍රැක්ටරය ඩීසල් ලීටර් 40 ක් | - රු. 4440.00 |
| SPLL 7103 ටිපර් රථය සඳහා ඩීසල් ලීටර් 200 ක් | - රු. 23200.00 |
| SPLL 7103 ටිපර් රථය සඳහා බ්‍රේක් ඔයිල් මිලි ලීටර් 500 | - රු. 570.00 |
| LL 7049 නෙළුව ප්‍රා.ස.ටිපර් රථය සඳහා ඩීසල් ලීටර් 200 | - රු. 24200.00 |
| LL 7119 තවලම ප්‍රා.ස.ටිපර් රථය සඳහා ඩීසල් ලීටර් 80 | - රු. 9680.00 |
| ගබඩා කර තබා ගැනීම සඳහා පෙට්‍රල් ලීටර් 50 | - රු. 7850.00 |
| 2T Oil ලීටර් 2 | <u>- රු. 1400.00</u> |
| **එකතුව** | **- <u>රු.194195.00</u>** |

**07. නීතිඥ හේමන්ත පී.ඩබ්ලිව් විතාරණ මයා, ලේන්බාන් වීදිය, කොටුව**

එල් එල් 15977 දරණ නඩුවට අදාළව 2021.12.15 දින නීතිඥ පෙනී සිටීමේ ගාස්තු -රු. 3000.00

**08. එච්.එල්.කේ.ශ්‍රීනිත් රුක්ෂාන් මයා, උඩුගම**

උඩුගම මහජන පුස්තකාලය සඳහා පුවත්පත් ලබාගැනීම වෙනුවෙන් ගෙවීම 2021 දෙසැම්බර් - රු. 6090.00

**09.එම්.ඒ.සිරිපාල මයා, සේසිරි ස්ටෝර්ස්, මාපලගම**
මාපලගම මහජන පුස්තකාලය සඳහා පුවත්පත් ලබාගැනීම වෙනුවෙන් ගෙවීම - රු. 6980.00
2021 ඔක්තෝමබර්,නොවැම්බර්,දෙසැම්බර්

**10. ඒ.ඩී. කරුණාරත්න මයා, සරත් ස්ටෝර්ස්, යටලමත්ත**
නාගොඩ මහජන පුස්තකාලය සඳහා පුවත්පත් ලබාගැනීම වෙනුවෙන් ගෙවීම
2021 දෙසැම්බර් - රු. 6810.00

**11.බී.ජේ.කරුණාරත්න,රත්නගිරි ස්ටෝර්ස්,මාපලගම**
මාපලගම මහජන පුස්තකාලය සඳහා පුවත්පත් ලබාගැනීම වෙනුවෙන් ගෙවීම - රු. 14360.00
2021 ඔක්තෝම්ර්,නොවැම්බර්,දෙසැම්බර්

**12.කේ.එම්.ටී.ඩිස්ට්‍රිබියුටර්ස්,ගාල්ල**
වීදි පහන් සඳහා led බල්බ් මිලදී ගැනීම - රු.156000.00
වයර් කොයිල් හා ස්විච් මිලදී ගැනීම (මන්ත්‍රී ප්‍රතිපාදන) - රු. 49860.00

**13.චමින්ද ඉලෙක්ට්‍රිකල්ස් මාතර**
වොට් 150 හා 100 ඔරේන්ජ් වීදි පහන් මිලදී ගැනීම(මන්ත්‍රී ප්‍රතිපාදන) - රු.337500.00

**14. එල්.එස්.ආර්. විජේතිලක මයා,ගා/නාගොඩ**
නාගොඩ ප්‍රාදේශීය සභා කැකුළු පෙර පාසල පවත්වා ගෙන යනු ලබන ගොඩනැගිල්ල
බදු පදනම මත පවත්වා ගෙන යන බැවින් ඒ සඳහා ජනවාරි මස මාසික කුලීය ගෙවීම - රු. 6000.00

**15. විගණකාධිපති, විගණන කාර්යාලය**

i. හිඟ විගණන ගාස්තු ගෙවීම - රු. 10150.00

ii. 2020 වර්ෂයට අදාළ විගණන ගාස්තු - රු.135600.00

**16. යශෝධරා රශිනි නාගොඩවිතාන මෙය**
සභාපතිතුමාගේ මහජන සම්බන්ධතා නිලධාරී සඳහා දීමනා ගෙවීම
(2021 දෙසැම්බර්) - රු.14500.00

**17. ඒ.කේ.නිලන්ති සජීවනී,ග්‍රාෆ් ටෙල් කමියුනිකේෂන්**

i. 2021 දෙසැම්බර් මස පැවති සභාවාරය සඳහා මහජන නියෝජිතයන් වෙනුවෙන් දුරකථන කාඩ්පත් ලබා දීමේ බිල්පත් පියවීම - රු.28500.00
ii. 2021 දෙසැම්බර් මස සභා වාර්තාව පිටපත් 30 ක් මුද්‍රණය කිරීම වෙනුවෙන් ගෙවීම් - රු. 2205.00

**18. නානායක්කාර හාඩ්වෙයාර්, නාගොඩ**
වීථි පහන් අළුත්වැඩියා කිරීම සඳහා යොදා ගන්නා උපාංග මිළදී ගැනීමේ බිල්පත - රු. 1120.00

**19. දයානි ට්‍රේඩ් සෙන්ටර්, මාපලගම**
චෙන්සෝ මැෂිම සඳහා චේන් එකක් මිලදී ගැනීම - රු. 4250.00

**20.ටී.ජී.සුමනසිරි ,නාගොඩ**
ටිපර් රථයේ ආවරණයට ඉටිකොළයක් මිලට ගැනීම - රු. 540.00

**21.ඩී.ජී.කැළුම් පුෂ්පකුමාර මයා, උඩුගම**

i. LL 7103 ටිපර් රථය සඳහා රබර් ග්‍රීස් බ්‍රේක් ඔයිල් යෙදීම හා ක්ලච් පොම්පය ගලවා අළුත්වැඩියා කිරීමේ වියදම් - රු. 4440.00

**22. සඳරු ග්‍රොසරි ඇන්ඩ් ග්‍රයින්ඩින් මිල්ස්, නාගොඩ**

i. ප්‍රාදේශීය සභාවේ 2021.12.14 වන දින පැවැත්වූ මාසික මහා සභා රැස්වීමේ සංග්‍රහ වියදම් සහ සෞඛ්‍ය ආරක්ෂිත ද්‍රව්‍ය මිළදී ගැනීමේ බිල්පත - රු. 5623.00

**23. එම්.ටී.ජනිත් ඉරේෂ් කුමාර මයා, වදුරඹ**

i. ප්‍රාදේශීය සභාවේ 2021.12.14 වන දින පැවැත්වූ මාසික මහා සභා රැස්වීමේ සංග්‍රහ බිල්පත (කෑම සඳහා) - රු. 5610.00

**පොදු අරමුදල්**

**24. පී.චානක රංග, චානක එන්ටර්ප්‍රයිසස්, කහදූව**

i. රතුමිල්ලවල කුරුදුකොළදෙණිය පයිනස් කන්ද මාර්ගය ජේ.සී.බී. යන්ත්‍රය යොදා සංවර්ධනය කිරීම වෙනුවෙන් මුදල් ගෙවීම - රු. 37500.00

ii. යෝජිත වලකුඹුර ආදාහනාගාරයේ පිවිසුම් මාර්ගය හා භූමිය සකස් කිරීමට ජේ.සී.බී. යන්ත්‍රය යෙදවීම වෙනුවෙන් මුදල් ගෙවීම - රු.288250.00

**25.ඩබ්.එච්.වී.කේ.ජී.වසන්ත,නාකියාදෙණිය**

අලුත්වත්ත 18 කන්ද , උඩුගම නැ.ජනසවිය ගම්මාන මාර්ගය , පැණිගලයාය මාර්ගය සුදුවැළිපොත මාර්ගය ජේ.සී.බී. යන්ත්‍රය යොදා සංවර්ධනය රු.130000.00

**26.චාමර කන්ස්ට්‍රක්ෂන් උඩුගම**

ඇප්තොප්වත්ත කුරුදුපැළ සිටුවීම සඳහා බිම සැකසීමට එක්ස්කැවේටරය යොදා ගැනීම වෙනුවෙන් ගෙවීම රු. 83850.00

**රජයේ ආධාර**

**පළාත් නිශ්චිත - 2021**

**27.මාපලගම ග්‍රාම සංවර්ධන සමිතිය, ඇතුමලේ**

තල්ගස්වල දෙමළ කණිෂ්ඨ විද්‍යාලයේ පාසල් භූමිය වටා ආරක්ෂිත ආවරණයක් ඉදිකිරීම වෙනුවෙන් මුදල් ගෙවීම - රු.224446.50

**28.කලඑළිය යාය ගොවි සංවිධානය, ගෝණදෙනිය**

අපර් හෝමදොළ කණිෂ්ඨ විද්‍යාලයේ සනීපාරක්ෂක පහසුකම් සංවර්ධනය කිරීම වෙනුවෙන් ගෙවීම් සිදු කිරීම - රු.485318.84

**29.එකමුතු ජොෂ්ඨ පුරවැසි සංවිධානය, කුරුපනාව**

තල්ගස්වල වතු යායේ දෙවන පටුමඟ පිටුපස ( පිට්ටනිය අසළ) භූමියේ වැසිකිළි පහසුකම් සංවර්ධනය කිරීම වෙනුවෙන් මුදල් ගෙවීම - රු.164610.99

**30.එකමුතු ජොෂ්ඨ පුරවැසි සංවිධානය, කුරුපනාව**

තල්ගස්වල වතු යායේ 01 කොටසට පිවිසෙන මුත්තුමාරි අම්මාන් කෝවිල ඉදිරිපස භූමියේ වැසිකිළියක් ඉදිකිරීමේ කර්මාන්තයේ මුදල් ගෙවීම - රු.162969.57

කොළඹ ගෙදර කුඩමලාන මාර්ගය සංවර්ධන කිරීම - රු.892389.73

**31.මාපලගම ග්‍රාම සංවර්ධන සමිතිය , ඇතුමලේ**
තල්ගස්වල වතුයායේ ශ්‍රී මුත්තුමාරි අම්මාන් කෝවිල අසළ ඇති දෙවන පටුමග සංවර්ධනය කිරීමේ කර්මාන්තයේ මුදල් ගෙවීම රු.1161900.00

**2020 සංවර්ධන සැළැස්ම**
**32.ග්‍රාම සංවර්ධන සමිතිය මාපලගම**
මාපලගම රණවිරුගම සුහසාධක සමිති ශාලා භූමියේ පැති බැම්ම ඉදි කිරීම(රුදවුම්) රු. 50000.00

**33.කුරුපනාව ගොවි සංවිධානය**
බන්දුල විජේසේකර මාවත සංවර්ධනය කිරීම(රුදවුම්) රු. 49774.00

**ඒ අනුව ඉදිරි ගෙවීම් වාර්තාවේ සදහන් ඉදිරි ගෙවීම් සහා අරමුදල් මගින් ගෙවීම සුදුසු බව ගරු සභාපතිතුමන් කල යෝජනාව ගරු මන්ත්‍රී චන්ද්‍රසිරි වනිගරත්න මහතා විසින් ස්ථිර කරන ලදුව ඒකමතිකව සභා සම්මත විය.**

**(ඉ).2 කර්මාන්ත යෝජනා**

**(ඉ) 2. ගරු සභාපතිතුමන් හා ගරු මන්ත්‍රීවරුන් විසින් ඉදිරිපත් කරන යෝජනා.**

**ගරු මන්ත්‍රී වෙරංග ලක්මාල් මහතා ඉදිරිපත් කරන යෝජනා**

01. නඩු අංක 06553 උඩුගම දිසා අධිකරණයේ ගොනු කර ඇති පස් ඇදීම සම්බන්ධ නඩුව මෙම වසරේ සිට සභාවේ පරිපාලනයට යටත්ව සිදු කර ගෙන යාමත් හා ඒ සඳහා දරණ නීතීඥ පෙනී සිටීමේ ගාස්තු සභා අරමුදලින් දැරීමටත් යෝජනා කරමි.

**ගරු මන්ත්‍රී වෙරංග ලක්මාල් මහතා විසින් ඉදිරිපත් කරන ලද ඉහත සඳහන් යෝජනාව ගරු මන්ත්‍රී සමන් විතානගේ මහතා විසින් ස්ථිර කරනු ලදුව ඒකමතිකව සභා සම්මත විය.**

**ගරු මන්ත්‍රී චන්ද්‍රසිරි වනිගරත්න මහතා ඉදිරිපත් කරන යෝජනා**

01.උඩුගම නැගෙනහිර ගුණානන්ද මාවතේ එක් බෝක්කුවක් සම්පූරණයෙන්ම අවහිර වීම හේතුවෙන් දිය පහර මාර්ගය හරහා ගලා බැසීම හේතුවෙන් මෙම මාර්ගය විනාශවීමට හැකි බැවින් ස්කැවේටර් යන්ත්‍රයක් යොදා එම බෝක්කකුව හා කාණුව සකස් කර දීමට යෝජනා කරමි.

**ගරු මන්ත්‍රී චන්ද්‍රසිරි වනිගරත්න මහතා විසින් ඉදිරිපත් කරන ලද ඉහත සඳහන් යෝජනාව ගරු මන්ත්‍රී විජිත් සහබන්දු මහතා විසින් ස්ථිර කරනු ලදුව ඒකමතිකව සභා සම්මත විය.**

02. උඩුගම නැගෙනහිර අක්කර 80 ගම්මානයේ වට රවුම් මාර්ගය සෝදා පාළුවට ලක්වීම හේතුවෙන් එම මාර්ගය බැකෝ යන්ත්‍රයක් යොදා සකස් කිරීමට යෝජනා කරමි.

**ගරු මන්ත්‍රී චන්ද්‍රසිරි වනිගරත්න මහතා විසින් ඉදිරිපත් කරන ලද ඉහත සඳහන් යෝජනාව ගරු මන්ත්‍රී විජිත් සහබන්දු මහතා විසින් ස්ථිර කරනු ලදුව ඒකමතිකව සභා සම්මත විය.**

**(ඉ) 2. 1. 11(8) යටතේ ඉදිරිපත් කරන යෝජනා**

**ගරු සභාපතිතුමා විසින් ඉදිරිපත් කරන යෝජනා**

01. අභාවප්‍රාප්ත නාගොඩ ප්‍රාදේශීය සභාවේ ප්‍රථම සභාපති මෙන්ම හිටපු දකුණු පළාත්සභා අමාත්‍යවරයෙක් වූ යූ.ජී.ඩී.ආරියතිලක මැතිතුමාගේ පළමු ගුණානුස්මරණ යෙදෙන දින එතුමා නමින් උඩලමත්ත ප්‍රදේශය මූලික කර ගෙන මාර්ගයක් නම් කිරීම සුදුසු බවට යෝජනා කරමි.

**ගරු සභාපතිතුමා විසින් ඉදිරිපත් කරන ලද ඉහත සඳහන් යෝජනාව ගරු මන්ත්‍රී ලක්රුවන් සම්පත් මහතා විසින් ස්ථිර කරනු ලදුව ඒකමතිකව සභා සම්මත විය.**

02. වර්තමානයේ ඇති වී ඇති ආහාර අර්බුධය හමුවේ සියළුම රාජ්‍ය ආයතන සතු වගාවන් නොමැති ඉඩම් වගාවන් කිරීම සඳහා යොදාගන්නා ලෙස ගරු ආණ්ඩුකාරතුමා දැණුම් දීම අනුව අප ප්‍රාදේශීය සභාව සතු මුඩු ඉඩම් වගාවන් සඳහා යෙදවීමට යෝජනා කරමි. ඒ අනුව මාපලගම රණවිරුගම ඇති සභාව සතු අක්කර 03 ක භූමිය වගාවන් කිරීම සඳහා රණවිරු සංසදය වෙත ලබා දීමට (ගිවිසුමක් අනුව) යෝජනා කරමි.

**ගරු සභාපතිතුමා විසින් ඉදිරිපත් කරන ලද ඉහත සඳහන් යෝජනාව ගරු මන්ත්‍රී පියල් හිරිමුතුගොඩ මහතා විසින් ස්ථිර කරනු ලදුව ඒකමතිකව සභා සම්මත විය.**

03. උඩුගම උප කාර්යාල භූමිය සභාව විසින් වගාවන් කරවීම

**ගරු සභාපතිතුමා විසින් ඉදිරිපත් කරන ලද ඉහත සඳහන් යෝජනාව ගරු මන්ත්‍රී වෙරංග ලක්මාල් මහතා විසින් ස්ථිර කරනු ලදුව ඒකමතිකව සභා සම්මත විය.**

04. ඇප්තොප්වත්ත ඉඩමේ පළාත් කෘෂිකර්ම අමාත්‍යාංශ හා සම්බන්ධව කර ගෙන කෘෂිකර්ම ගොවිපලක් පිහිටුවීම ( මේ පිළිබඳව අදාළ අමාත්‍යාංශයේ ලේකම්තුමා කැමැත්ත දැක්වූවා. ඔවුන්ගේ සහය ලබා දෙන බවට.)

**ගරු සභාපතිතුමා විසින් ඉදිරිපත් කරන ලද ඉහත සඳහන් යෝජනාව ගරු මන්ත්‍රී වසන්ත කුමාරගේ මහතා විසින් ස්ථිර කරනු ලදුව ඒකමතිකව සභා සම්මත විය.**

05. උඩුගම මාළු වෙළඳ සැළ තිබූ සභාව සතු ගොඩනැගිල්ල පොල් ආශ්‍රිත නිශ්පාදන සඳහා භාවිතා කිරීමට යෝජනා කරමි.

**ගරු සභාපතිතුමා විසින් ඉදිරිපත් කරන ලද ඉහත සඳහන් යෝජනාව ගරු මන්ත්‍රී වෙරංග ලක්මාල් මහතා විසින් ස්ථිර කරනු ලදුව ඒකමතිකව සභා සම්මත විය.**

06. නාගොඩ ප්‍රාදේශීය සභාව, සංවර්ධන සැළැස්ම - 2022 සභාවට ඉදිරිපත් කිරීමට යෝජනා කරමි.

**ගරු සභාපතිතුමා විසින් ඉදිරිපත් කරන ලද ඉහත සඳහන් යෝජනාව ගරු මන්ත්‍රිනී නෙලී වක්වැල්ල මහත්මිය විසින් ස්ථිර කරනු ලදුව ඒකමතිකව සහා සම්මත විය.**

07. ඩයලොග් දුරකථන කුළුණක් සේරවත්ත, උඩලමත්ත, ගාල්ල ලිපිනයේ ඉදිකිරීම සඳහා අයදුම්පත්‍රයක් අප වෙත යොමු කර ඇති අතර, ඒ සඳහා සභාවේ අනුමැතිය ලබා ගැනීමට යොජනා කරමි.

**ගරු සභාපතිතුමා විසින් ඉදිරිපත් කරන ලද ඉහත සඳහන් යෝජනාව සභා සම්මත නොවුනි.**

08. දුරකථන, ජල බිල්, විදුලි බිල්පත සඳහා මාසික ගාස්තු ගෙවීමේදී ගෙවීම් ප්‍රමාද වුවහොත් මාසිකව අධි ගාස්තුවක් අය කරනු ඇත. එමෙන්ම එක් මසක ගාස්තුවක් ගෙවීම ප්‍රමාද වුවහොත් විසන්ධි කිරීම්ද කරනු ඇත.

එම නිසා මෙම බිල්පත් සභාගත කර ගෙවීම් කිරීමේදී ප්‍රමාදයක් සිදු වන බැවින්, බිල්පත් ලද සැනින් ගෙවීම් කර, ගෙවීම් කරන ලද බිල්පත් පිළිබඳ වාර්තාවක් සභාවට ඉදිරිපත් කිරීමට යෝජනා කරමි.

**ගරු සභාපතිතුමා විසින් ඉදිරිපත් කරන ලද ඉහත සඳහන් යෝජනාව ගරු මන්ත්‍රිනී නෙලී වක්වැල්ල මහත්මිය විසින් ස්ථිර කරනු ලදුව ඒකමතිකව සභා සම්මත විය.**

09. නාගොඩ ප්‍රාදේශීය සභාවේ පෙර පාසල් 15 හි ළමුන් සඳහා විසිර යාමේ උත්සවය වෙනුවෙන් පොත් හා පාසල් උපකරණ ලබා දීම සඳහා විනෝදා සිටුඩියෝ ඇන්ඩ් බුක් ෂොප් වෙතින් ලබාගන්නා ලද පාසල් උපකරණ සඳහා වූ රු. 446700.00 ක බිලක් ඉදිරිපත් වී ඇත. ඒ සඳහා අනුමත වී ඇති ප්‍රතිපාදන මුදල වන ලක්ෂ 03 ක මුදල මේ සඳහා ගෙවීමටත් වැඩි වූ රු. 146700.00 ක මුදල ගෙවීම සඳහා නැවත සභා අනුමැතිය ලබා ගෙන එය ආණ්ඩුකාරතුමාගේ අනුමැතිය සඳහා යොමුකිරීමටත් යෝජනා කරමි.

**ගරු සභාපතිතුමා විසින් ඉදිරිපත් කරන ලද ඉහත සඳහන් යෝජනාව ගරු මන්ත්‍රී වසන්ත කුමාරගේ මහතා විසින් ස්ථිර කරනු ලදුව ඒකමතිකව සභා සම්මත විය.**

10. නාගොඩ ප්‍රාදේශීය සභාවේ තැන්පත් ලේඛනයේ 2016 වර්ෂයේ සිට ඇති පොදු තැන්පත් ගිණුමේ තැන්පතු 11 ක් සඳහා මුදල් ආදායමට ගැනීමට අනුමැතිය සඳහා යෝජනා කරමි.

**ගරු සභාපතිතුමා විසින් ඉදිරිපත් කරන ලද ඉහත සඳහන් යෝජනාව ගරු මන්ත්‍රිනී නෙලී වක්වැල්ල මහත්මිය විසින් ස්ථිර කරනු ලදුව ඒකමතිකව සභා සම්මත විය.**

**ගරු මන්ත්‍රිනී ගයන්ති කුමාරි මහත්මිය සභාවෙන් අවසරගෙන පෙ.ව.11.34 ට සභාවෙන් පිටව යන ලදී.**

**(ඉ) 3. ඇස්තමේන්තු ඉදිරිපත් කිරීම**

01. උඩුගම සතිපොළේ කඩකාමර ප්‍රතිසංස්කරණය කිරීම - රු. 320000.00
02. උඩුගම සතිපොළ සඳහා ජලය සැපයීම - රු. 27000.00
03. 212 ඒ කැප්පිටියාගොඩ උතුර සංවර්ධන ගම්මානයේ අතුරු මාර්ගයක් වන කරව්වකන්ද පාරට සම්බන්ධවන මාර්ගය සංවර්ධනය කිරීම - රු. 100000.00
04. උඩුගම සති පොළේ කඩ කාමර ප්‍රතිසංස්කරණය කිරීම - රු. 350000.00
05. අකුලහේන ධර්මදූත මධ්‍යස්ථානය විලමාවත මාර්ගය JCB යන්ත්‍රයක් යොදවා සංවර්ධනය කිරීම - රු. 37500.00

**ඉහත සඳහන් ඇස්තමේන්තු සභාව පිළිගත යුතු බවට ගරු උප සභාපති එම්.කේ.ගාමිණී සුසන්ත මහතා විසින් යෝජනා කල අතර, ගරු මන්ත්‍රී සමන් නාපෙ විතානගේ මහතා විසින් ස්ථිර කරන ලදුව ඒකමතිකව සහා සම්මත විය.**

**(ඉ).4 මිළ ගණන් ඉදිරිපත් කිරීම**

**නාගොඩ ප්‍රා දේශීය සභාවේ RA 8570 ට්‍රැක්ටර් රථයේ අලුත්වැඩියාව සඳහා ලැබී ඇති මිළ ගණන්**

| විස්තරය | මනහර මෝටර්ස්, මාපලගම | නිව් අයන් වර්ක්ස්, මාපලගම | ලාල් මෝටර්ස්, නාගොඩ | උඩුගම මෝටර් ඉංජිනියර්ස්, උඩුගම |
|---|---|---|---|---|
| RA 8570 ට්‍රැක්ටර් රථයේබ්‍රේක් පද්ධතිය අලුත්වැඩියාව | 32875.00 | 33000.00 | 29500.00 | 25200.00 |

නාගොඩ ප්‍රාදේශීය සභාවේ RA 8570 ට්‍රැක්ටර් රථයේ අලුත්වැඩියාව සඳහා ලැබී ඇති මිළ ගණන් අනුව ඒ සඳහා අවම මිළ ගණන් ඉදිරිපත් කර තිබූ උඩුගම මෝටර් ඉංජිනියර්ස්, උඩුගම වෙතින් නාගොඩ ප්‍රාදේශීය සභාවේ RA 8570 ට්‍රැක්ටර් රථය අලුත්වැඩියා කිරීම සුදුසු බව ගරු මන්ත්‍රී විජිත් සහබන්දු මහතා විසින් යෝජනා කල අතර, ගරු මන්ත්‍රිනි ප්‍රියන්තා ගුණසේකර මහත්මිය විසින් ස්ථිර කිරීමෙන් අනතුරුව ඒකමතිකව සහා සම්මත විය.

**නාගොඩ ප්‍රාදේශීය සභාවේ වීථ පහන් අලුත්වැඩියාවට යොදා ගන්නා ඉනිමඟ අලුත්වැඩියාව සඳහා ලැබී ඇති මිළ ගණන්**

| විස්තරය | ලාල් මෝටර්ස්, නාගොඩ | මනහර මෝටර්ස්, මාපලගම | නිව් අයන් වර්ක්ස්, මාපලගම | සිතුමිණ ලේත් වර්ක්, ඇතුමලේ |
|---|---|---|---|---|
| මෝල් පටි අල්ලා ෆයිබර් කර ඇජස්මන්ට් සකස් කර තීන්ත ආලේප කිරීම | 24875.00 | 28500.00 | 26000.00 | 28000.00 |

නාගොඩ ප්‍රාදේශීය සභාවේ වීථ පහන් අලුත්වැඩියාවට යොදා ගන්නා ඉනිමඟ අලුත්වැඩියාව සඳහා ලැබී ඇති මිළ ගණන් අනුව ඒ සඳහා අවම මිළ ගණන් ඉදිරිපත් කර තිබූ ලාල් මෝටර්ස්, නාගොඩ වෙතින් නාගොඩ ප්‍රාදේශීය සභාවේ වීථ පහන් අලුත්වැඩියාවට යොදා ගන්නා ඉනිමඟ අලුත්වැඩියා කිරීම සුදුසු බව ගරු මන්ත්‍රී ලක්රුවන් සම්පත් මහතා විසින් යෝජනා කල අතර, ගරු මන්ත්‍රිනි සුභාෂි ඒකනායක මෙනවිය විසින් ස්ථිර කිරීමෙන් අනතුරුව ඒකමතිකව සහා සම්මත විය.

**නාගොඩ ප්‍රාදේශීය සභාවේ Toshiba e studio 2309 A ඡායා පිටපත් යන්ත්‍රයට ටෝනර් ලබා ගැනීම සඳහා ලැබී ඇති මිළ ගණන්**

Toshiba e studio 2309 A ඡායා පිටපත් යන්ත්‍රයට ටෝනර් රු. 17172.00

නාගොඩ ප්‍රාදේශීය සභාවේ Toshiba e studio 2309 A ඡායා පිටපත් යන්ත්‍රයට ටෝනර් ලබා ගැනීම සඳහා ගිවිසුම්ගත ආයතනය වන ජෝන් කීල්ස් ආයතනයෙන් ටෝනර් ලබාගැනීම සුදුසු බව ගරු මන්ත්‍රී අජිත් එඩේරආරච්චි මහතා විසින් යෝජනා කල අතර, ගරු මන්ත්‍රී එන්.වී.පතිනායක මහතා විසින් ස්ථිර කිරීමෙන් අනතුරුව ඒකමතිකව සභා සම්මත විය.

**නාගොඩ ප්‍රා දේශීය සභාවේ Gestetner MP 2001 L ඡායා පිටපත් යන්ත්‍රයට ටෝනර් ලබා ගැනීම සඳහා ලැබී ඇති මිළ ගණන්**

Gestetner of Ceylon PLC රු. 9703.00 +Vat

නාගොඩ ප්‍රාදේශීය සභාවේ සභාවේ Gestetner MP 2001 L ඡායා පිටපත් යන්ත්‍රයට ටෝනර් ලබා ගැනීම සඳහා ගිවිසුම්ගත ආයතනය වන Gestetner of Ceylon PLC ආයතනයෙන් ටෝනර් ලබාගැනීම සුදුසු බව ගරු මන්ත්‍රීනි සුභාෂි ඒකනායක මෙනවිය විසින් යෝජනා කල අතර, ගරු මන්ත්‍රී ලක්රුවන් සම්පත් මහතා විසින් ස්ථිර කිරීමෙන් අනතුරුව ඒකමතිකව සභා සම්මත විය.

**(ඊ) කාරක සභා වාර්තා**

**(උ). ලැබීම් හා ගෙවීම් වාර්තා**

**වෙනත් කරුණු**

**ගරු මන්ත්‍රී පියල් හිරිමුතුගොඩ මහතා**

ගරු සභාපතිතුමා ඇතුළු සියළුම මන්ත්‍රී මණ්ඩලයෙන් අවසරයි. පසුගිය මස රිය අනතුරකට ලක්වීම හේතුවෙන් මා හට නන් අයුරින් උදව් උපකාර කල සභාපතිතුමා ඇතුළු සියළුම මන්ත්‍රීවරුන්ට බෙහෙවින් ස්තූතිවන්ත වන අතර, ඒ වගේම මාගේ සහෝදරියගෙ මලගෙදරට සහභාගී වූ සියළුම මන්ත්‍රීවරුන්ට හා මන්ත්‍රීවරියන්ට මාගේ හෘදයාංගම ස්තූතිය පුද කරනවා. බොහෝම ස්තූතියි.

**ගරු මන්ත්‍රී චන්ද්‍රසිරි වනිගරත්න මහතා**

ගරු සභාපතිතුමා ඇතුළු සියළුම මන්ත්‍රී මණ්ඩලයෙන් අවසරයි. අලුත්වත්ත තේ ශක්ති සමිතිය හරහා ලක්ෂ 40ක ගොඩනැගිල්ලට මුල් ගල තැබුවා. ගරු සභාපතිතුමා, ඔබතුමාගේ සහයෝගයට ස්තූතියි. ප්‍රදේශවාසීන් හා සමිතිය වෙනුවෙන් ඔබතුමාට ඒ සම්බන්ධව ප්‍රසාදය පළ කර සිටිනවා. සභාව මගින් පාරවල් කිහිපයක් හැදුවා. ඒ වගේම පැණිගලයාය මාර්ගයේ බයිසිකලයක්වත් යන්න බැරුව තිබුනේ. 18 කන්ද මාර්ගය සකස් කර ගැනීම වෙනුවෙන් මා මේ අවස්ථාවේදී ප්‍රදේශවාසීන්ගේ සතුට මම පිළිගන්නනවා. මේ සම්බන්ධව ප්‍රායෝගික ගැටළුවකුත් තියෙනවා. මාර්ගය පුළුල් කිරීමේදී වගා කල ඉඩම් හරහා යන පාරවල් පවරා නොගැනීමේ ගැටළුව තුළ කිසිම ඉඩම් හිමිකරුවකු උඩලමත්ත

නැගෙනහිර ජනසවිය පාර පුළුල් කිරීමට කැමති නැහැ. එම මාර්ග පවරා ගැනීමේ කටයුතු කරන්න කියලා මම ඉල්ලා සිටිනවා. බොහොම ස්තූතියි.

**ගරු උප සභාපති එම් කේ ගාමිණී සුසන්ත මහතා**

සියලු දෙනාගෙන්ම අවසරයි. උඩලමත්ත හඟරන්වල මාර්ගය ගම්සභා මාර්ගයක්. අඩි 08 තමා ගම් සභාවේ තීරණය වෙලා තියෙන්නේ. ජනතාවගේ සහයෝගයෙන් මේක හැදුවා. නමුත් පසුගිය වර්ෂා තත්ත්වය නිසා මෙය මාමනදොළට කැඩිලා ගිහිල්ලා, අඩි තුනක් පමණ තමයි ඉතිරි වෙලා තියෙන්නෙ. පුට් සයිකලයක් විතරයි යන්න පුළුවන්. මේ යෝජනාව මේ සභාවට දාන්න කාලවේලාව මදි නිසා ඊළඟ සභාවට, ලිඛිතව යෝජනාව ඉදිරිපත් කරනවා. පෙට්ටි ගල් දාලා තමයි මේක හදන්න වෙන්නේ. එතරම් මුදලක් වසමකට ලැබෙන්නේ නැහැ. ඒ නිසා මේ සඳහා තාර බැරල් යොදන්න කියලා තමයි කාර්මික නිලධාරීතුමා තීරණය කළේ. ඒ සඳහා තාර බැරල් මිලදී ගන්න මමත් ආයතන කිහිපයකින් හොයල බලන්නම්. ඒ සඳහා අවශ්‍ය කටයුතු කරන්න කියලා මම සභාවෙන් ඉල්ලනවා. ඒ හිස් තාර බැරල් පිරවීමට අවශ්‍ය පස් යටලමත්ත පිට්ටනියෙන් කපන පස් වලින් ලබා දෙන්න කියලා ගරු සභාවෙන් මම ඉල්ලා සිටිනවා. බොහොම ස්තූතියි.

**ගරු මන්ත්‍රී තරංග සුදර්ශන මහතා**

ගරු සභාපතිතුමා ඇතුළු සියලු මන්ත්‍රීවරුන්ගෙන් මන්ත්‍රීවරියන්ගෙන් අවසරයි. සභාපතිතුමනි, අද සභාවේ දීර්ඝ වශයෙන් කතා කිරීමට බලාපොරොත්තු වෙන්නේ නැහැ. සභාවේ කියවුණු යම් යම් කාරණා සමඟ විසඳාගත යුතු දේවල් තියෙනවා. මේ වාර්තාවල තියෙනවා. පළාත් සභා මන්ත්‍රීවරු එක එක නම් වලින් ප්‍රතිපාදන එවල තියෙනවා කියලා. පළාත් සභාවත් විසුරුවපු කාලයක එක එක නම් වලින් ප්‍රතිපාදන එවන්න පුලුවන්ද? පෙර පාසල් සඳහා අහවල් මන්ත්‍රීවරු එවපු ප්‍රතිපාදන කියලා, මේ සභාවේ නම් වලින් කිව්වා. නමුත් පළාත් සභා විසුරුවලා, අවුරුදු ගාණක් වෙනවා. නමුත් ආණ්ඩු පක්ෂය කොහොමද ප්‍රාදේශීය සභාවට අරමුදල් එවන්නෙ කියලා දැනගන්න අවශ්‍යයි.

ඊළඟ කාරණය අපේ සහෝදර මන්ත්‍රීවරු ගැන. අපේ මන්ත්‍රීවරු යම් කාරණාවලට විරුද්ධයි. ඔබතුමා ඉදිරිපත් කරනවා. යම් යම් අවස්ථාවලදී ඇස්තමේන්තු හා යෝජනා ඒ කිසි දෙයක් බලන්නේ නැතිව, අපි විරුද්ධ වෙයි කියලා බලාගෙන, ඒවා ස්ථිර කරනවා. නමුත් ලක්ෂ දාසයක ඇස්තමේන්තුවක් තියෙන එකේ ලක්ෂ 12 ක් යන එක අපට ප්‍රශ්නයක්. නමුත් අපි එදා ඉදලම දැනගෙන හිටියා ඒත් පොදු අරමුදලින් කරන වැඩ වලට අපේ කට්ටිය හරි කැමතියි. මන්ත්‍රීතුමා මේ ක්‍රමවේදයට අපි විරුද්ධයි යම් යෝජනාවක් කරනකොට විස්තර කරන්න ඕන. නමුත් ඇස් ඇරෙන්නෙ ඊළඟට බිල එවනකොට ඉදිරි ගෙවීම් ස්ථිර කරන විට හොඳට කියවලා බලලා කරන්න ඕන. ඒ කණ්ඩායමම ඊළඟ දවසෙදි අහනව මේකට මෙච්චර උනේ කොහොමද කියලා මගේ සහෝදර මන්ත්‍රීවරුන්ගෙන් මම ඉල්ලා සිටිනවා මේ සල්ලි කාගේද මහජනතාවගේ මේ අනුව කටයුතු කරනකොට ඔය ආදාහනාගාරය පාර මම ගිහිල්ලා තියෙනවා නමුත් මම දන්නෙ නැහැ ඕකට ලක්ෂ දාසයක් වැනි මුදලක් යනවද කියලා. නමුත් අවසානයේ නීත්‍යානුකූලයි. ඔබතුමත් කියනවා මම හොරකම් කරන්නේ නැහැ. නමුත් හැමදාම ඒක වෙන්නෙත් නැහැ. ඔබතුමා සම්බන්ධ වෙන්නේ නැතුවට මේ දේ සිදුවෙනවා. සභාපතිතුමනි මම ඔබතුමාට නෙමෙයි මෙම චෝදනාව කරන්නේ. අපේ සහෝදර මන්ත්‍රීවරුන්ට. හැමදාම ඇවිල්ල අඩුපාඩු පෙන්නලා යනවා. නමුත් අවසානයේදී ඒව ගෙවනවා. මේ නිලධාරීන්ටත් කේන්ති ඇති. ඒගොල්ලන්ගෙ කණ්ඩායමක් මේක හදලා ඉදිරිපත් කරනවා. අතිකාල ගෙවනවා නම් නිලධාරී විදිහට යම් සේවාවක් කරනවා නම්, යම් සේවයක් ඉෂ්ඨ කරන්න ඕන. සභාවේ මුදල් ගෙවීම් හරි විදියට වැඩ කරලා, රජයේ වැටුපක් ගන්න එතුමන්ලා කටයුතු කරන්න ඕන. ඒ අතිකාල දීමනා සාධාරණයි. මොකද මම දන්නවා සමහර දවසට ලයිට් හදන වාහන රෑටත් වැඩ කරනවා. අපි දන්නේ නැහැ. ඒවට අතිකාල කොයි ආකාරයෙන්ද ගෙවන්නේ කියලා. රෑ දෙකට සභාවේ වාහනේ කෘ කැබ් එක හම්බ වෙනවා. ඒවා ඉතින් සාධාරණ හේතු ඇති. ගැටළුවක් නැහැ.

හැබැයි ඕටී එක හැම මාසෙම එකම ගාන. උපරිම ගාන ඒකද? රියදුරන්ට විතරද අතිකාල ගෙවන්නේ? කොහොමද මේකෙ ක්‍රමවේදය. මොකද ඔබතුමා කියනවා. මම මේක පාලනය කරගන්නෙ කොහොමද කියලා. එහෙම වෙන්න බැනේ, සභාපතිතුමණී, නිලධාරීන්ට හරි උපදෙස් දීලා සභාව නිවැරදිව මෙහෙයවන්න ඕන. විශේෂයෙන්ම අපේ සහෝදර සේවකයින්ට අසාධාරණයක් වුන වෙලාවට අපි පෙනී සිටිනවා. යම් වැරද්දක් වුනා කියල පේනවනම්, ඒ වෙනුවෙන් පෙනී සිටිනවා. අපට ඒ පුද්ගලයෝ ගැන පුද්ගලික අමනාපයක් වත් හිතවත්කමක් වත් අවශ්‍ය නැහැ. සාධාරණ විදිහට කරන්න. නිවැරදි උපදෙස් දෙන්න. වැරදි දේවල් කරන්න ඉඩ තියන්න එපා කියලා සභාපතිතුමාගෙන් ඉල්ලා සිටිනවා. වාර්තාවල අඩුපාඩු සභාවට බෙදන්න කලියෙන් නැවතත් පරීක්ෂා කරන්න කියලා ඉල්ලා සිටිනවා. ගරු සභාපතිතුමනි, උඩුගම දකුණ දිවාරාත්‍රී වොලිබෝල් ක්‍රීඩාංගනයක් හදනවා කියලා උත්සවයකුත් තියලා තිබුණා. ඒක ලඟදි ඉදි වෙනවද? නැත්නම් ප්‍රතිපාදන ගිහිල්ලා, වෙනත් ප්‍රදේශයක ඉදි වෙනවද කියල හොයල බලන්න. නැත්නම් හැම සභාවාරයකදිම කියවෙනවා මිලියන ගානක ක්‍රීඩා පිටි සම්බන්ධව. මේ සභාවට ප්‍රතිපාදන ආවහම ද, මේ උත්සව තියන්නෙ? හට් ගහනවා. ජාතික අපරාධ ඒවා. එම කර්තව්‍යය සිදුවෙනවා නම් කමක් නැහැ. නමුත් ඒවා උත්සව වලට සීමා වෙලා, උඩලමත්ත දකුණ වොලිබෝල් ක්‍රීඩාංගනය ඉදි වෙනවා ද නැද්ද කියලා තමයි අහන්නේ.

ඒ වගේම පියල් මන්ත්‍රීතුමාගේ සහෝදරියගේ අභාවය ගැන කනගාටුව ප්‍රකාශ කරනවා. පියල් මන්ත්‍රිතුමාට මම ස්තූතිවන්ත වෙනවා. එතුමා පොදුවේ ආරාධනාවක් කළා. ඒක තමයි මම මේ සභාවේ දැකපු පළමු ආරාධනය. පානීය ජල ව්‍යාපෘතිය සම්බන්ධ වැඩක් නිසා ඔබතුමාලා කවුරුත් සහභාගි වෙන්න කිවුවා. නමුත් උඩුගම පුරනැගුම ශාලාවේ තියෙන උත්සව වලට නම් අපට ආරාධනාවක් නැහැ. ඒව තියෙන්නෙ බඩු බෙදන ඒවා. පානීය ජලය පොදු වුනාට, රටේ මහජනතාවගේ සල්ලිවලින් කරන දේවල් වලට අනෙත් මන්ත්‍රීවරුන් ආරාධනා කරන්නේ නැත්තේ ඇයි කියලා අපට ප්‍රශ්නයක් නැගෙනවා.

ඒ වගේම අවසන් වශයෙන්, උඩුගම රෝහලට පහුගිය දිනවල කෝටි ගණනක දැඩි සත්කාර ඒකකයක් ලැබුනා. ඒ සඳහා උඩුගම ප්‍රදේශයේ නාකියාදෙනිය වතු සමාගමේ යම් දායකත්වයක් දීලා ආරම්භයක් ලබා දුන්නා. විශේෂයෙන්ම මමත්, විලේගේ මන්ත්‍රිතුමාත්, ඒක නියෝජනය කරනවා. අපේ ඒ සමිතියෙ උප සභාපති ලෙස ඉන්නේ, අපේ හිටපු සභාපති අජිත් මැතිතුමා. ඒ සියලු දෙනා වෙනුවෙන් හා වතු සමාගමට අපි හැමදාම අඩුපාඩු කියලා බනිනවා වගේම කෝටි ගානක් වියදම් කරලා විවෘත කරන්න කෙටි කාලයක් ඇතුළත ධෛර්ය, ශක්තිය, සහයෝගය ලබා දුන් සියලුම දෙනාට ස්තූතිවන්ත වෙනවා. සභා ශ්‍රවණාගාරය ලබාදීම සම්බන්ධයෙන්, එම අවස්ථාවේ සභාවට ස්තූතියක් කළේ නැහැ. නමුත් සුළු සේවකයන්ට පවා ස්තූති කලා. මම මේ අවස්තාවේදී එම ශාලාව ලබාදීම සම්බන්ධව, සභාවට විශේෂ ස්තූතියක් පුදකර සිටිනවා. ඔබ සැමට 2022 නව වසර වාසනාවන්ත වසරක් වේවා කියා ප්‍රාර්ථනා කරමින් මා නිහඩ වෙනවා,ස්තූතියි.

**ගරු මන්ත්‍රී රංජිත් ජයවීර මහතා**

ගරු සභාපතිතුමා ඇතුළු සමස්ත සභාවෙන් අවසරයි. උඩුගම m.o.h. කාර්යාලය වෛද්‍යවරුන් 8 දෙනෙකුගෙන් සමන්විතයි. මට මතකයි කොරෝනා සම්බන්ධව එන්නත් ලබා දීමේදී, මම ඉන්න අවස්ථාවේ එම රෝහලේදි එක ළමයෙකුට කලන්තෙ ගියා. ඒ වගේම ගර්භණී මාතාවන් එන්නත් ගන්න එනවා. නමුත් කිසිම පහසුකමක් නැහැ. ත්‍රිපෝෂ එක උඩින් මීයො දුවනවා. හැකියාවක් තියනවනම් වෛද්‍යතුමන් සමග කතා කරලා, m.o.h. කාර්යාලය ඉඩ පහසුකම් සහිත ස්ථානයකට ගන්න. නාගොඩ ග්‍රාමීය රෝහල අසල ගොඩනැගිලි තියෙනවා. එම ස්ථානයකට හෝ අරගන්න.

ජනතාවට පහසු බල ප්‍රදේශයේ මධ්‍යස්ථ ස්ථානයක මෙම m.o.h. ස්ථාපිත කරන්න කියලා ඉල්ලීම කරනවා.

ඒ වගේම සාමාන්‍යයෙන් පාරවල් සංවර්ධනය කරගෙන යමින් පවතිනවා. ගම් වල අහිංසක මිනිස්සු ඉන්නේ. පරණතානායම්ගොඩ කපල්විල ගල්කන්ද මාර්ගය, එම ප්‍රදේශයේ පවුල් දාහතරක් පමණ ජීවත් වන අතර, ඔවුන්ගේ එදිනෙදා ජීවන කටයුතු සඳහා ගමන් කරන මාර්ගය ඔවුන් ශ්‍රමදාන මට්ටමින් සකස් කරගෙන යන අතර, මාර්ගයේ බෝක්කු සඳහා සිළිංඩර් දෙකක් ලබාදෙන ලෙස ඉල්ලා සිටිනවා. ගමේ මන්ත්‍රීවරයාට දැනුම් දුන්නත් ලැබිලා නැහැ. ඒ නිසා ඒ මිනිස්සු මහන්සියෙන් හදාගත් පාර සඳහා අවශ්‍ය සිළිංඩර් ලබා දෙන ලෙස නැවතත් ඔබතුමාගෙන් ඉල්ලා සිටිනවා. විලේගේ මන්ත්‍රීතුමා කිව්වා නිර්නාමික ලිපියක් එවල තියෙන්නෙ කියලා. මටත් ඇඩ්‍රස් කරලා, ව්‍යාපාරික ප්‍රජාව විසින් තමයි එවලා තියෙන්නෙ.

**ගරු මන්ත්‍රී අමර ධනංජය මහතා**

ලිපිය කවුද එවල තියෙන්නෙ කියලා අපි අහන්නේ? කොහේ ව්‍යාපාරික ප්‍රජාව ද?

**ගරු මන්ත්‍රී රංජිත් ජයවීර මහතා**

ඇත්තටම මේක සත්‍යක් කියලා කොටස ඔබතුමන් පිළිගන්න. ඇත්තටම මේ කුඹුරු ගොඩ කරල තියෙන්නෙ. මට ඇස් දෙකෙන් දැක ගන්න පුලුවන්. ඉපනැල්ල ඉවර වෙන්න ඉස්සෙල්ලා කම්බි ගහලා, වැටවල් ගහලා, තේ පැල හිටවලා තියෙන්නේ. තල්ගස්වල 215 b අලුත් පහළ බටහිර වැනි හැම ග්‍රාම නිලධාරී වසමකම මෙවැනි තත්වයන් තියෙනවා. ගෙවලුත් හදලා. මේ පිළිබඳ කිසිම සොයා බැලීමක් නැහැ. ඒක අපරාදයක්. මේ සම්බන්ධයෙන් පසු විපරමක් තියෙන්න ඕන. ඒ වගේම මේ වීපී ලාම්පු දාන්නේ, අවශ්‍ය සුදුසු ස්ථානවලට නෙවෙයි. අපේ ගමේ දරුවෝ රෑ අට නමය වෙලා පන්ති ගිහිල්ලා එන්නෙ. ඒ වගේම ගාමන්ට් ගිහිල්ලා එන උදවිය ඉන්නවා. පාරේ අඳුර ස්ථාන රාශියක් තියෙනවා. හවස් වන විට ගංජ කාරයොයි, කුඩු කාරයොයි, කසිප්පු කාරයොයි පාරවල්වල සැරිසරනවා. මේ අඳුරු ස්ථානවල එක වීපී ලාම්පුවක්වත් නැහැ. මේ අයගේ ජීවිත අනතුරේ. පොදු මුදල් පොදු මහජනතාවට දෙන්න ඕන දේවල් මේ කොට්ඨාස පහළොවකට වෙන් කරලා, ක්‍රමවේදයකට කරගෙන යන්න. ඔබතුමාට ගෙවල් හදන්න ප්‍රතිපාදන අනුමත වෙලා තියෙනවා. තවම ගෙවල් හදලා ඉවර නැහැ. ඇත්ත තත්ත්වය ඕකයි සභාපතිතුමනි. මම මීට වඩා කතා කරන්න අදහස් කරන්නේ නැහැ. ස්තුතියි.

**ගරු සභාපතිතුමා පිළිතුරු දෙමින්**

සභාගත කෙරුණු ලිපිය නිර්නාමික වුවද, මෙහි සඳහන් කරුණ සත්‍ය බව ඔබ අපි කව්රුත් දන්නා කරුණක්. ඔබ අපි කවුරුත් දන්නවා බල ප්‍රදේශයේ මොනයම් හෝ ඉදිකිරීමක් කරනවානම්, සභාවෙන් අවසර ගත යුතුයි කියලා. නමුත් තමන්ට ණයක් ගැනීමේදී ඇතිවන ගැටළු නිසාවෙන්, ඒ අවස්ථාවේ එම ස්ථාන පමණක් සභා අවසර ගැනීමට ඉදිරිපත් වෙනවා. අතීතයේ සිට එන ක්‍රමයක්. මම මේ සම්බන්ධව නීතිය ක්‍රියාත්මක කළොත්, ඇතිවන තත්වය කොහොම වේවිද? ඊළඟට අනවසර ගොඩකිරීම් පිළිබඳවද සඳහන් වෙලා තිබුණා. ඔබතුමාලට පාරෙ යන එන විට පේනවානේ කෙතරම් කුඹුරු ගොඩකර තිබෙනවාද කියලා. උදාහරණයක් ලෙස උඩුගම සිට නාගොඩ දක්වා එද්දි දෙපස කුඹුරු ගොඩ කිරීම් පේනවා නේද? මේවා ගොවිජන සේවා නිලධාරීන්ගේ රාජකාරි. ඒවා ඉටුවන්නෙත් නැහැ. නමුත් මේ සෑම දෙයකින්ම සිදුවන්නේ සභාව අපහසුතාවයට පත්වීමයි. ජනතාව

සිතන්නේ මේවා සභාව හෝ සභාපති දැනුවත්ව කරන ඒවා ලෙසයි. මම නම් මේ කිසිම දේකට අනුබල දීලත් නැහැ. දෙන්නෙත් නැහැ. ලබාදෙනවා මි දුන්නේ සියළු අදාළ නිලධාරීන්ගේ වාර්තා ලබාගෙන. ජයවීර මන්ත්‍රීතුමා ප්‍රකාශ කල පරිදි ගංජාකාරයෝ, කුඩුකාරයේ, කසිප්පුකාරයේ ඉන්නවා කියලා. අපිට හැම තැනම වීථි පහන් දමන්න වුණා. නමුත් මේ තාක් දැමූ වීථි පහන් අදාළ බල ප්‍රදේශයේ මන්ත්‍රීතුමන්ලා පෙන්නා දීපු ස්ථානවලයි දැම්මෙ.

**ගරු මන්ත්‍රී සමන් නාපෙවිතානගේ මහතා**

ගරු සභාපතිතුමනි, මන්ත්‍රීවරුනි, කතා කළත් වැඩක් නැහැ. නමුත් හෝමදොල පොලීසිය අසල පාර water board එකෙන් කඩල තියෙනවා. දැන් එතන ලොකු වලවල් දෙකක් තියෙනවා. තරංග මන්ත්‍රීතුමාත් දකින්න ඇති. මම හිතන්නේ සභා වාර 20- 30 අතර කාලයේ ඉල්ලුම් කරපු දෙයක්. අපි මේ සභාවෙ කරන හැම යෝජනාවකටම පක්ෂයක් ලෙස අත උස්සලා, ඉෂ්ට කරල දෙනවා. ඔබතුමා තාක්ෂණ නිලධාරි මහත්තයත් එක්ක ගිහිල්ලා, බලලා, ඊට පස්සෙන්දා කරන දෙයක් විදිහට කතා කරලා ආවා. මෙක ඇස්තමේන්තු කරලා, ගරු සභාවට දාන්න කියලා දැන් අවුරුද්දක් වෙනවා. ගරු සභාපතිතුමනි, මෙතනත් තාක්ෂණ නිලධාරීන් මහත්වරු දෙන්නෙක් ඉන්නවා. මිස්කෙනෙක් ඉන්නවා. නමුත් අපි එතුමන්ලාට කවදාවත් චෝදනා කරන්න යන්නේ නැහැ. අපි නවක මන්ත්‍රීවරු. අපි මේ සභාවට ගේන්න අජිත් එඩේරආරච්චි මහතා ඇතුළු මන්ත්‍රි මණ්ඩලය කැපවීම් කලා. ශ්‍රේෂ්ඨ මන්ත්‍රීවරුන්ගෙන් දැනමුතුකම් අපි මෙතනින් ඉගෙන ගත්තා. ඒ නිසා අපි කවදාවත් මෙතනින් බැහැල යනකොට, විපක්ෂ මන්ත්‍රීවරුන් එක්කවත් ගැටුමක් ඇති කර ගන්න බලාපොරොත්තු වෙන්නේ නැහැ.

ජනඋදාන ගම්මානයේ පාලමත් කැඩිලා තියෙනවා. ගම්වාසීන් දෙන්නෙකුට හානි වෙලා තියෙනවා. සම්බන්ධීකරණ කමිටුවේ දී මේ සම්බන්ධව කතා කරද්දී, RD එකෙන් හදලා ඉල්ලනකොට ඔබතුමා මේක සභා පාරක් කිව්වා. ජනාධිපතිතුමා ආපු වෙලාවේ ඒක RD එකට කිව්වනම්, RD එකෙන් ඒ පාර හදනවා. ගරු සභාපතිතුමා උඩුගම පාරක් සුද්ධ කරන්නවත් කම්කරුවෙක්වත් යොදවලා නැහැ. ඔබතුමා උඩුගමට මොකුත් කරලා නැහැ.

**ගරු සභාපතිතුමා පිළිතුරු දෙමින්**

මන්ත්‍රීතුමා මෙම පාර ජනාධිපතිතුමාගේ ගම සමඟ පිළිසඳර වැඩසටහනට කාපට් කර සංවර්ධනය කල පාරක්. ඒ අවස්ථාවේ මෙම මාර්ගය සභාවට අයත්ද PRD එකට අයත්ද RD එකට අයත්දැයි අපෙන් විමසුවාම එය සභාවට අයත් බව අප පැවසුවා. RD එකෙන් තමයි කාපට් කරේ. ඔය පාලම් පිළිබඳව ඒ දවස්වල සඳහනක් නැහැ. තවද මන්ත්‍රීතුමා ඔබතුමා මට චෝදනා කරනවා. උඩුගම මොනවත් කලේ නැහැ කියලා. ඔබගේ එම යෝජනාව අදම නිශේද වෙනවා. බලන්න වනිගරත්න මන්ත්‍රීතුමාගේ ප්‍රකාශය දිහා හැබැයි මමත් 2002 සිට අද දක්වා මේ සභාව නියෝජනය කරනවා. අද වගේ නෙවෙයි එදා සභාපතිට ඕනෑම තැනක ගොස් වැඩ කරන්න පුළුවන්. දැන් කොට්ඨාස ක්‍රමය තුල මොනවා හෝ කරන්න ගියොත් අහනවා. මම නොකියා ඕවා කරන්නෙ ඇයි කියලා. ඔබතුමාම මන්ත්‍රීවරු සමඟ වාද වෙනවනේ. නමුත් මන්ත්‍රීතුමා අපි නම් කවදාවත් හිටපු සභාපතිතුමන්ලට කිව්වෙ නැහැ. නාගොඩට වැඩ කලේ නැහැ කියලා. ඔවුන් කල දෙයක් ඇත්තෙත් නැහැ. නමුත් අපි කියන්න ගියේ නැහැ. උඩුගම, නාගොඩ කියලා භේදයක් අපි අතර තිබුනෙ නැහැ. මෙය මේ අවස්ථාවෙ කිව යුතු නොවූවත්, විලේගේ සභාපතිතුමාගෙන් වීථි ලාම්පුවක්වත් මට දමා ගන්න බැරි වුනා. මෙතන හිටපු සභාපතිවරු දෙන්නෙක් ඉන්නවා.

**ගරු මන්ත්‍රී සමන් නාපෙ විතානගේ මහතා**

නෑ සභාපතිතුමනි අපි ඔබතුමා සමග ගැටෙන්න යන්නේ නැහැ. අපි ඔබතුමාගෙන් ප්‍රශ්නයක් අහද්දී, ඔබතුමා කියනවා. මම හොරෙක් නෙවෙයි කියලා. අපේ කටහඬ වහන්නම තමයි. ඔබතුමා මම හොරෙක් නෙවෙයි කියලා කියන්නේ. නමුත් මම දන්නවා ඔබතුමා හොරකම් කරන්නේ නැහැ කියලා. අපි මේවට අත උස්සන්නෙ ඔබතුමා කෙරෙහි තියෙන විශ්වාසයට. ඉදිරියෙදි මෙතන ප්‍රශ්නයක් ආවම ඕනම දේකට ඡන්දය දෙද්දී දෙපාරක් හිතලා තමයි ඡන්දය ප්‍රකාශ කරන්නේ. උප සභාපතිතුමාගෙන් අහල තමයි මම දෙයක් කරානම් කළේ. සභාවෙන් අපට කිසිම දෙයක් වෙන්නෙ නැහැ. බල්බ 1000 ක් ගෙනාවා කියලා යෝජනාවක් ආවා. මම දන්නේ නැහැ කොහෙද බල්බ සවි කළේ කියලා. සභා කාලය තව අවුරුද්දකින් කල් ගිහිල්ලා තියෙනවා. ඒක ඉවර වුණා නම් හොඳයි කියලත් හිතෙනවා. මේ ජ්‍යේෂ්ඨ මන්ත්‍රීවරුන් ගෙන් ගොඩක් පාඩම් ඉගෙන ගත්තා. ඔවුන් අපට දැනමුතුකම් ලබා දුන්නා. දූරියන් ගහ කපනකල් කෑගැහුවා. ඔබතුමා ඒක කැපුවා. අපට තව පුංචි කාලයයි තියෙන්නේ. අපි මේ සභාවේ වාඩිවෙලා මොකද කරන්නේ කියලා බලාගෙන හිටියා. ඒත් ඔබතුමා මේ අවුරුදු හතරටම කිසිම දෙයක් කළේ නැහැ. මේ හැම ප්‍රදේශයක් පිළිබඳව සොයා බලන්න ඔබතුමාට අයිතියක් තියෙනවා. ඔබතුමා අසාර්ථක නැහැ. හොඳ වැඩක් කලා. ආදාහනාගාරයක් ගහනවා. හොඳට වැඩ යනවා. කොට්ඨාස පහළොවක් තියෙනවා. එක කොට්ඨාශයකට විතරක් නෙවෙයි වැඩ කළ යුත්තේ. අපි මේ වගේ ඉන්න නෙවෙයි එන්නේ. මේවා පුහු වචන වෙනවා. මේ සභාවට දාලා, ඉසුරු ඇමතිතුමා ඇස්තමේන්තු අනුමත කරලා, ඉල්ලුවා. ඒවා කරන්න බැරිනම්, මොකක්ද මන්දා මේ සභාව කියලා අපට හිතෙනවා. හැමදාම නිහඬ වෙන්න බැහැ. අනෙක් දේවල් කරන්න බැරිනම්, හෝමදොල කැඩුණු ස්ථාන දෙක හදලා දෙන්න. බොහොම ස්තූතියි

**ගරු මන්ත්‍රී වසන්ත කුමාරගේ මහතා**

සියලුම සභිකයින්ගෙන් අවසරයි. මම සඳහන් කරන්න ඕන. සභා වාර්තාව හා නිලධාරීන් පිළිබඳව විවේචනය ඇතිවෙච්ච මොහොතක, මම මේකෙ ඇඟිල්ල දිගු කරන්නේ ඔබතුමාට. මොකද මේ පිළිබඳ හරිහැටි අධ්‍යනයක් නොකොට තමයි, මේ සභාවේ කටයුතු සිදුකරන්නේ. සභාවට ඉදිරිපත් කරන ලේඛන, සභාවට දින හතර පහකට කලින් සභාවට ඉදිරිපත් කරන්න ඕන. එහෙම නැතුව සභාව තියන්න කලින් දිනයේ හරි, සභාව තියෙන දිනයේ හරි සභාවට ගෙනත් දෙනවා. මේ නිසා නිලධාරින් අපහසුතාවයට පත් වෙනවා. මොකද නිලධාරී කියන්නේ මැෂින් නොවෙයි. සමහර වෙලාවට මම පෞද්ගලිකව දන්නවා. සභාව තියෙන දවසේ උදේ වව්චර් ගෙනත් දෙනවා. කලබලේ ගෙවීම් වාර්ථා හදන්න යද්දි, යම් යම් පටලැවිලි තත්ත්වයන් මතු වෙනවා. මින් ඉදිරියටවත් යම් වැඩපිළිවෙළක් යටතේ මේ දේවල් කරන්න කියලා ඔබතුමාට කියනවා. ඒ නිසා අහක ඉන්න නිලධාරීන් මේ මන්ත්‍රීවරුන්ගෙන් බැනුම් අහනවා. සමහරවිට මේ කැපවීමෙන් වැඩ කරන නිලධාරීන් වෙන්න ඇති.

ඒ වගේම හැමදාම සෞභාග්‍යය දැක්ම පිළිබඳව කතා කරනවා. අද වන විට බොහොම අමාරුවෙන් කරපු ගොවිතැන් ටික, වන සතුන් විසින් හානි කරනවා. ප්‍රචාරක රථයක් හරි යවලා, මේ අයාලේ යන ගවයින් බැඳගන්න කියලා අයිතිකාරයන්ව දැනුවත් කරන්න ඕන. මේ ප්‍රශ්නය සම්බන්ධව අවුරුදු ගානක් කතා කලා. ගව අයිතිකරුවන් මේ ගැන තැකීමක් කරන්නෙ නැහැ.

ප්‍රාදේශීය සභා පෙර පාසල් 15ක් තියෙනවා. සහය පාලිකාවන් ඉන්නවා. ඇත්තටම ඒ අයට රජයෙන් කිසිම මුදලක් ගෙවීම් කරන්නේ නැහැ. රුපියල් දෙදහස් පන්සියයක් දෙනවා කියලා කිව්වා. තවම මාස දෙකයි දීලා තියෙන්නේ. පෙර පාසල් වල ළමයි 30-35 ක් ඉන්නවා. ඒ නිසා අනිවාර්යයෙන් සහය පාලිකාවක් අවශ්‍ය වෙනවා. ඔවුන්ට දීමනාවක් දෙන්න කියලා කියනවා. ඒ වගේම මාපලගම

මහජන ක්‍රීඩාංගණය සංවර්ධනය පිළිබඳව ඇත්තටම මම සතුටු වෙනවා. ඒක හොඳ වැඩක්. සභාවට ආපු දවසෙ ඉඳල මගේ ඉල්ලීම තමයි මෙම ක්‍රීඩා පිටිය සංවර්ධනය සහ ළමා උයනක් ඉදි කිරීම.

රජයේ නිලධාරීන් මොන මොන ඇස්තමේන්තුව ඉදිරිපත් කළත්, මන්ත්‍රීවරුන්ට අයිතියක් තියෙනවා. මේ වැඩකටයුතු වෙන්නේ කොහොමද? එහි පිළිවෙළ දැනගන්න. මොකද ඉදිරි ගෙවීම් සභාවෙන් අනුමත කර ගද්දි, ඒ පිළිබඳව අපේ දැනුවත් භාවයක් තියෙන්න ඕන. එවැනි දේවල් මෙතෙක් කලකට දැනගන්න ලැබුණේ නැහැ. සභාපතිතුමනි, කොට්ඨාස මන්ත්‍රීවරුන්ගේ අදහස් ඇති. මේ දේවල් ගමේ ඉදිවෙද්දී, යම් සංවර්ධන කටයුතු කරනවා නම්, මහජන නියෝජිතයන්ගේ අදහස් අරගෙන කළ යුතුයි. ඒ නිසා වෙන්න ඇති. ගම්වල යම් යම් පුද්ගලයන්ගේ මේ වැඩ කටයුතු සම්බන්ධයෙන් අප්‍රසාදය පලවෙන්නේ. කොට්ඨාස මන්ත්‍රීවරු මේ සම්බන්ධව දැනුවත් වුණා නම්, රජයට මෙවැනි අපවාද හම්බ වෙන්නේ නැහැ. සංවර්ධන කටයුතුවලට කාර්තුවකට ලක්ෂ 6 ක් පාස් වෙනවා. කුරුඳු පැළ වැනි දේවල් දීලා, දේශපාලන ප්‍රවර්ධන කටයුතු තමයි කරන්නෙ. රාජ්‍ය සේවකයන්ට රුපියල් 5000 කින් පඩි වැඩි කළා. මොනවද මේ ආණ්ඩුව කරන්නේ. ගමේ අහිංසක මනුස්සයගෙ ආදායම වැඩි කරගන්න සහන දෙන්න තිබුණා. පොහොට්ටුවේ ආණ්ඩුවෙ හරි දැක්මක් හා වැඩ පිළිවෙළක් නැති නිසා, ඉබාගාතේ ඔහේ යන ආණ්ඩුවක් බවට පත්වෙලා තියෙනවා.

**ප.ව. 1.30ට ගරු සභාපතිතුමා සභාවෙන් අවසර ගෙන, හදිසි කටයුත්තක් සඳහා යාමට ඇති බැවින්, උප සභාපතිතුමාට සභාව මෙහෙයවීමේ කටයුතු සිදු කරන ලෙස දැනුම් දෙන ලදී.**

**ගරු උප සභාපතිතුමා සභාව මෙහෙයවීමේ කටයුතු ආරම්භ කරන ලදී.**

**ගරු උපසභාපතිතුමා අදහස් දක්වමින්**

ඇත්තටම වසන්ත මන්ත්‍රීතුමා, ඔබතුමා කියන කාරණා සම්බන්ධයෙන් මට පිළිතුරු දීමේ හැකියාවක් නැහැ. මොකද මම අද මේ මොහොතේ සිට තාවකාලිකව සභාව මෙහෙයවීමේ කටයුතු කරගෙන යන්නේ. මට අද පොදු ස්ථානයක් ලැබිලා තියෙන්නෙ. ඒ නිසා එහි ගෞරවය රැකගෙන, සභාව මෙහෙයවන එක තමයි මගේ යුතුකම. ඔබතුමාගේ කතාවේ ප්‍රශංසා, ගැරහීම්, චෝදනා හැම දෙයක්ම තිබුණා. ඔබතුමාට ස්තුතිවන්ත වෙනවා. තවත් මන්ත්‍රීවරුන් ඉන්නවනම්, ඉතාම කෙටියෙන්, තමන්ගේ අදහස් ප්‍රකාශ කරන්න කියලා ඉල්ලා සිටිනවා.

**ගරු මන්ත්‍රී චන්ද්‍ර සහබන්දු මහතා**

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මම ප්‍රශ්න කරපු කොම්පෝස්ට් පොහොර ප්‍රශ්නය සම්බන්ධව, ඒකට පිළිතුරක් දීලා තිබුණා. නමුත් ඒ අවස්ථාවේ මම හිටියේ නැහැ. සභාපතිතුමා නැතිව නැවත ප්‍රශ්න කරන්නත් බැහැ.

ඒ වගේම කැලි කසල එකතු කිරීම පාඩුයි.

ඊයෙ වෙනකොට කොච්චර තියනවද ස්ටොක් එක උප සභාපති තුමනි,

**ගරු උප සභාපති තුමා පිළිතුරු දෙමින්**

එතන හැඳින්වීමක් කළේ නැහැ

**ගරු මන්ත්‍රී චන්ද්‍ර සහබන්දු මහතා**

දිනකට නිෂ්පාදනය කොපමණද, මෙතෙක් මාසිකව ගණනය කලාට පසු, අඩුම ගානේ මාස 3ක අලවිය, මාස තුනේ වියදම. මාස 3ට මෙතනට යොදවපු කැළි කසළ ප්‍රමාණය කොපමණද? මම දකිනවා උඩුගම ප්‍රදේශයේ හුඟදෙනෙක් ඔතනට වෙලාලු ඉන්නේ. ඒ නිසා මේකට වැඩපිළිවෙළක් තියෙන්න ඕන. මේ සඳහා හරියාකාර වැඩපිළිවෙළක් සකස් කළොත්, නිකන් එන කුණු ටිකෙන් කොම්පෝස්ට් හදන්න, අවශ්‍ය සේවක පිරිස යෙදෙව්වොත්, අප ආයතනයට ලාභයක් ගන්න පුළුවන් කියලා පැහැදිලිවම මට කියන්න පුළුවන්. අලාභ වෙන්න හේතුව, සේවකයන් පිළිබඳ සොයා නොබලා, අනවශ්‍ය ප්‍රමාණයක් මේකට යොදවලා තියෙනවා. නමුත් දිනකට කම්කරු මහත්තරු කීදෙනෙක් වැඩ කලාද කියන එක ඔය ලිපිගොනුවේ නැතුව ඇති. ගරු උප සභාපතිතුමනි, අත්හරින්න එපා. කොම්පෝස්ට් ව්‍යාපාරය අද මේ රටේ ඇහැ ගහගෙන ඉන්න ව්‍යාපාරයක්. ඒ පිළිබඳව අවධානය යොමු කරලා, සොයා බැලීම් හා අවශ්‍ය ක්‍රියාදාමය තුළ, ලාභ ලැබිය හැකි ව්‍යාපාරයක් බවට පත් වෙනවා. මේ වන විට ඔතන කිලෝග්‍රෑම් පණහක් නැතුව ඇති. සියලුම ආදායම දෛනිකව ලැබෙන්න ඕන. ඒකයි ක්‍රමවේදයකට එනවනම් කළ යුත්තේ. ඒ පිළිබඳව ලේකම්තුමියගේ අවධානය යොමු කරන්න කියලා ඉල්ලා සිටිනවා.

ඊළඟට ගරු සභාපතිතුමනි, උඩුගම කාර්යාලයේ එක්කෙනාට එක පොත ගානෙ තියෙනවලු අත්සන් කරන්න. අවසානයේ පොත් ටික ගැනල්ලා දීලා මෙහෙ අත්සන් ටික හදනවා. ඒ දේ වැරදියි. ඇඟිලි සලකුණු යෙදීම උඩුගම කාර්යාලයේ තිබුණෙ නැහැ.

**ගරු උපසභාපතිතුමා අදහස් දක්වමින්**

උඩුගම උප කාර්යාලයේ පොත් දෙකයි ලු තියෙන්නෙ.

**ගරු මන්ත්‍රී චන්ද්‍ර සහබන්දු මහතා**

රෑට මුර කරලා, දවල්ට කුරුඳු වගා කරන ස්ථානයේ වැඩ කරනවලු. එහි නීත්‍යානුකූල භාවයක් නැහැ. හදිස්සියක් වුනොත් කිසිම වගකීමක් නැහැ. අනියම් සේවකයෝ , උප සභාපතිතුමනි, සභාපතිවරයා මෙලෝ රහක් නැහැ. අවුරුදු හතරක් මෙතන, අද විදුලිය වැරදියි. වාහන වැරදියි. සේවක ප්‍රශ්න බලනකොට, ඒක වැරදියි. වෙලාවට සල්ලි ටික ලැබුණු නිසා ඔය ආදාහනාගාරය, වෙළඳ සංකීර්ණය කලා. ඒකෙත් ක්‍රමවේදය වැරැදියි. j c b යන්ත්‍රය තාම එක තැන තියෙනවා. ඩෝසරයක් ගෙනාව නම් ඔය පාර කපලා, කාපට් කරලාත් ඉවරයි. මම අහන්නේ කෙටි ප්‍රශ්නයක්. කවුද හොරා කියලා. එහෙම නැති වෙන්න පුළුවන්. මීට වඩා සැලැස්මක් ඇතිව කටයුතු කළා නම්, මේ අවුරුදු හතරක කාලය තුළ, අතිකාල කෝටි ගානක් මේ සභාවේ ගෙවලා තියෙනවා. නමුත් එක පාරක් සංවර්ධනය කරගන්න බැරි වුණා. කම්කරු මහත්වරු ඉන්නවා. නමුත් එක පාරක් සුද්ද වෙලා නැහැ. දැන් ඉන්න කම්කරු මහත්වරු දැන් ඉන්නේ කාර්යාලවල. මන් දන්නෙ නැහැ පළාත් සභා මන්ත්‍රීවරු ද කියන එක. මෙතුමා කිව්ව වගේ ප්‍රතිපාදන එවනවා ලු. පළාත් සභා නම් වැරදියි. මීට වඩා උප සභාපතිතුමත් එක්ක විවාදයක් අවශ්‍ය වෙන්නේ නැහැ. පොහොර ප්‍රශ්නය සම්බන්ධයෙන්, කුඩා තේ වතු හිමියෝ කවුරු කිව්වත් තේ,විනාශ වෙලා ඉවරයි. අපේ මිනිස්සු බඩගින්නෙ ඉන්නවා. රුපියල් අට දාහෙ පොහොර දාලා, නඩත්තු කරන්න බැහැ. දළු කිලෝ 1000 ක් කඩපු අපිට කිලෝ 300ක් කඩන්න බැහැ. ආණ්ඩුවට විපක්ෂයට මේවා තේරෙන්නේ නැහැ.
එමෙන්ම මුදල් ගෙවීම් වාර්තාවේ අතිකාල සම්බන්ධයෙන් කතා කරනවානම්, කැබ් එකක් ගරාජ් එකේ, ට්‍රැක්ටරයත් කැඩිලා තිබුණා, ටිපර් රථයත් කැඩිලා තිබුණා කියලා ආරංචි වුණා. රියදුරන් වෙනත් වෘත්තීන්වලට යෙදෙව්වා කියලා කියනවා. නමුත් අතිකාල 8000.00, 5000.00,7000.00 ආදී

වශයෙන් තියෙනවා. හැමදාම එකම අතිකාල ප්‍රමාණයක් තියෙනවා. මෙහෙම වෙන්නෙ කොහොමද සභාපතිතුමනි, අතිකාල ලබාගන්න උපරිම සීමාව කීයද? බල්බ් සම්බන්ධයෙන් කතා කරන විට බල්බ් වැඩිපුර ගෙනෙද්දි ඔබතුමාටත් අයිතියක් තියෙනවා. මෙච්චර බල්බ් ගේන්නෙ මොකටද කියලා හොයලා බලන්න. සතියකින් බල්බ් එක පිච්චෙනවනම්, එතන දෝෂයක් තියෙනවා නේද? ඒවගේම ඒ අලුත්වැඩියාවලදීත් සේවකයන් දෙතුන් දෙනෙක් යන විට අමතර පිරිවැයක් දරන්න වෙනවා.
ඒ වගේම සුනඛ හා හරක් ප්‍රශ්නය දැන් බොහොම වැඩියි. ඉදිරියේදී ජලභීතිකාව වැනි රෝග ඇතිවෙන්න පුළුවන්. ඒ පිළිබඳව අවධානය යොමු කරන්න කියලා ඉල්ලනවා. බොහොම ස්තූතියි.

**ගරු මන්ත්‍රී ධර්මසිරි ගනේවත්ත මහතා**

සියලුම දෙනාට සෞභාග්‍යමත් වසරක් ප්‍රාර්ථනා කරමින්, අත්‍යවශ්‍ය කාරණයක් සඳහා සභාවෙන් බැහැර වීමට අවසර ඉල්ලා සිටිනවා.

**ගරු මන්ත්‍රී ධර්මසිරි ගනේවත්ත මහතා සභාවෙන් අවසරගෙන ප.ව 1.50 ට සභාවෙන් පිටව යන ලදී.**

**ගරු මන්ත්‍රී අමර ධනංජය විලේගේ මහතා**

ගරු උප සභාපතිතුමාගෙන් අවසරයි. ඇත්තටම වසර හතරක කාලයක් අවසන් වෙලා, ජනතා නියෝජිතයන් ලෙස ලබාගත් දැනුම් සම්භාරය විශාලයි. ජනතා නියෝජිතයින් හැටියට ප්‍රදේශයට කරන්න පුළුවන් උපරිම සේවාවක් කලා. මම හිතන්නේ සමහර වෙලාවට අපි ප්‍රාදේශීය නියෝජිතයෙක් වුනේ ඇයි කියන තැනට අපි තල්ලු වෙලා තියෙනවා. මම ඒක දකින්නේ අපේ ආයතනයේ අපේ ප්‍රධානියාගේ අඩුපාඩු ගොඩක් තියෙනවා. එවැනි තත්වයකදී අපි අන්ත අසරණ වුන වෙලාවල් මන්ත්‍රීවරු විදිහට අනන්තයි. අප්‍රමාණයි. 2010 පස්සේ අපි ආණ්ඩු බලය අරගෙන, පක්ෂ මන්ත්‍රීවරු විදිහට, අපේ ගමන ආරම්භ කරනවත් එක්කම, දැකපු නැති, මුහුණ දීලා නැති, දැවැන්ත වසංගතයක් මුළු ලෝකය පුරාම පැතිරුනා. ජනතාව ඔවුන්ගේ ආරක්ෂාව ගැන හිතන්නෙ නැතුව, වැඩ කරලා ගොඩක් දෙනා මේ වසංගතයට ලක්වුනා. අපේ මන්ත්‍රීවරුන් පවා රෝගී තත්ත්වයන්ට පත්වුණා. මේ වන විට තෙවැනි බූස්ටර් එන්නතක් ලබා දීමට කටයුතු කිරීම සම්බන්ධව අපේ ජනාධිපතිතුමා ඇතුළු අපේ ආණ්ඩුවට ස්තුතිවන්ත වෙනවා.

ඒ වගේම තේ වගාව සම්බන්ධ ප්‍රශ්නයේදී, මම ජීවිතේ පළමු වතාවට විපක්ෂ නායකතුමත් සමග එකඟ වෙනවා. ඒ වගේම මම අපේ පක්ෂ, විපක්ෂ මන්ත්‍රීවරුන්ට ආරාධනා කරනවා. මේ වෙනුවෙන් අපි දෙයක් කල යුතුමයි. අපේ ප්‍රදේශවල 99% ක් ජීවත් වෙන්නේ තේ වගාවෙන්. අද ඩොලර් එක වැඩි වෙලා තියෙනවා. පොහොර වැඩි වෙලා තියෙනවා. නමුත් අමු තේ දළු වල මිල වැඩි වෙලා නැහැ. ඇත්ත වශයෙන්ම හොඳ දේට හොඳයි කියන්න ඕන. නරක දේට නරකයි කියන්න ඕන. කාබනික වගාවට ගිය එක හොඳයි. ලෙඩ රෝගවලින් වැළකී ජීවත් වෙන්න පුළුවන්. නමුත් මම පැහැදිලිව කියනවා. ප්‍රායෝගිකව කාබනික පොහොර තේ වගාවට යොදා ගන්න බැහැ. නයිට්‍රජන් අමුද්‍රව්‍ය 20% ක් තේ වගාවට අවශ්‍යයි. නමුත් කාබනික පොහොර වලින් නයිට්‍රජන් ලැබෙන්නේ 4% යි. කොම්පෝස්ට් යොදලා තේ වගාව කරන්න බැහැ. පොහොර සහනාධාර වෙනුවට, පොහොර කොට්ටයක් රුපියල් අට දාහයි. දළු කඩන පුද්ගලයන්ට 1000.00 යි. අනෙක් වැඩ කරන්න රුපියල් 2000.00 ක් අය කරනවා. මේ කටයුතුත් එක්ක තේ වගාව ඉතාම අමාරු තැනකට වැටිලා තියෙනවා. ඉතින් මේ අවස්ථාවේදී යම්කිසි ස්ථිර වැඩපිළිවෙළක් කරන්න යෝජනා කරන්න කියලා මම ඉල්ලනවා. ඇත්තටම පාර්ලිමේන්තුවේ විපක්ෂයවත් මේ ගැන කතා කරන්නේ නැහැ. මම කනගාටු

වෙනවා ගමේ මිනිස්සුත් එක්ක ඉන්න මහජන නියෝජිතයන් විදිහට, ඔවුන්ට මේ සම්බන්ධයෙන් සාධාරණයක් ඉටු කරන්න බැරි වීම සම්බන්ධව. ඒ වගේම හිටපු ජනාධිපති මහින්ද රාජපක්ෂ මැතිතුමාට ස්තුතිවන්ත වෙනවා. පොහොර රුපියල් 350ට 1500 ට දුන්නා. නමුත් කැගහන අනිත් අය දුන්නේ නැහැ. මේ ප්‍රශ්නය සම්බන්ධයෙන් අපි මැදිහත් වීමක් විය යුතුමයි. නැත්නම් විශාල ආර්ථික හානියක් වෙනවා වගේම, ඉදිරි දේශපාලන කටයුතුවලටත් තදින්ම බලපානවා. ජනතාව අපහසුතාවයට පත්වන මේ කාරණාව සම්බන්ධයෙන් සියලු දෙනාම හඬක් නගමු යනුවෙන් ප්‍රකාශ කරමින්, මම නිහඬ වෙනවා.

**ගරු මන්ත්‍රී ලක්රුවන් සම්පත් මහතා**

සභාවේ යම් යම් කරුණු කාරණා පිළිබඳව මෙන්ම, විශාල වශයෙන් ආණ්ඩුව විවේචනය වුන අවස්ථාවකදී මේ උඩවැලිවිටිය කොට්ඨාසයේ මාර්ගයක් සංවර්ධනය කිරීම සම්බන්ධයෙන් පැහැදිලි කිරීමක් කරන්න ඕන. මම අපේ ගරු සභාපතිතුමාගෙන් හා තාක්ෂණ නිලධාරී මහත්වරුන්ගේ මගපෙන්වීම යටතේ උඩවැලිවිටිය ගම්මැද්දේගොඩ යාකරණ මාර්ගය කාපට් අතුරා සංවර්ධනය කරන්න තව දින කිහිපයක් තියෙන නිසා, අතුරු මාර්ගයක් හැටියට, එම ප්‍රදේශයේ ජනතාවට ගමන් කිරීම සඳහා රතුමිල්ලවල කුරුඳු කොලනිය ෆයිනස් කන්ද දක්වා මාර්ගය JCB යන්ත්‍රයක් යොදවා සංවර්ධනය කිරීමට ගිය සභාවට පෙර සභාට යෝජනාව ඉදිරිපත් කළා. ගිය සභාවෙ ඇස්තමේන්තුව ඉදිරිපත් කරලා, නීත්‍යානුකූලවම මේ කටයුතු කළා. එතන ප්‍රශ්නෙකුත් තියෙනවා. ප්‍රාදේශීය සභාව සතු පාරවල් පවරා නොගැනීම හා ඒ දෙපස අනවසර ඉදිකිරීම් විශාල වශයෙන් සිදු වෙනවා. නමුත් මම මේ වෙලාවේ කෙරෙන යෝජනා සහ සභාවේ සාකච්ඡා වන කාරණා සම්බන්ධව, සභාවේ කාර්ය මණ්ඩලය මගින් ඊළඟ සභාව වෙනකම්, යම් කාර්යයක් කරන්නෙත් නැහැ. පසු විපරමක් කරන්නෙත් නැහැ. මේ සභා වාරයේදී සිටවත් ඊළඟ සභා වාරය වන විට මොනව හරි උත්තරයක් ඒ සම්බන්ධව ලබා දෙන්න කියලා ඉල්ල සිටිනවා. අපේ ප්‍රාදේශීය සභාවේ පාරවල් 1970 ගණන් වල ගැසට් කරාට පස්සේ, මේ වෙනකන් එකපාරක්වත් ගැසට් කරල නැහැ. බරපතල ප්‍රශ්නයක් තියෙනවා. මන්ත්‍රීවරු විසි හත් දෙනෙක් ඉන්නවා. මේ සඳහා අපි විසි හත් දෙනාම වගකියන්න ඕන. ගරු සභාපතිතුමා එතනදි පාලක පක්ෂය හැටියට, විශේෂයෙන්ම මේ කාර්යයේ දී අපට මේ වගකීම ගන්නම වෙනවා. හේතුව මේ වන විට ජනගහනය වැඩිවෙනවා. අවශ්‍යතාවයන් වැඩිවෙනකොට මිනිස්සු පාර හරි අල්ලගෙන කොටුකර ගන්නවා. කෙහෙල් පැලයක් හැරි හිටවනවා. මේවට නීති අණපනත් තියෙනවා. සභාවට ඇවිල්ල කිව්වම, තාක්ෂණ නිළධාරි මහත්මාට මේ සම්බන්ධව තීරණයක් ගන්න බැහැ. මොකද නීත්‍යානුකූලව සභාවට පවරා ගෙන නැති නිසා. කොට්ඨාශයට වග කියන මන්ත්‍රීවරයෙක් ඉන්නවා. තවත් මන්ත්‍රීවරු ඉන්නවා. ඒ අයගේ උදව් අරගෙන, බල ප්‍රදේශයේ සියලුම පාරවල් ටික ගැසට් කරන්න කියලා ඉල්ලා සිටිනවා. මෙය විශේෂ යෝජනාවක් ලෙස යෝජනා කරනවා.

ඒ වගේම ගෙවීම් වාර්තාව සකස් කිරීමේ අඩුපාඩු සම්බන්ධයෙන් විවේචන ඉදිරිපත් කළා. මම දන්නවා මේ සම්බන්ධව මම සොයා බැලුවා. මේ ආයතනයේ අවුරුදු ගණනක් පරණ පරිගණක යන්ත්‍ර තමයි තවම පාවිච්චි කරන්නේ. ඒ නිසා යම් යම් දෝෂ ඇතිවෙනවා. ඒවටත් මුහුණපාමින් තමයි මේ නිලධාරීන් කටයුතු කරන්නේ. පරිගණක යන්ත්‍ර කිහිපයක් හෝ ලබාදීමට කටයුතු කරන්න. පාරවල් වල වගේම තමයි. නිලධාරීන්ට පරිපාලනය දුර්වල වුනහම, මේ වගේ දේවල් වෙනවා. සභාපතිවරයාට වගේම ලේකම්තුමිය ඇතුළු කාර්යමණ්ඩලයේ වගකීම තමයි මෙය පවත්වාගෙන යාම. ඒකෙදි සේවකයන් මනා කළමනාකරණයකින් හැසිරවීම වැනි දේවල් තියෙනවා. අතිකාල සම්බන්ධයෙන් ලොකු චෝදනාවක් තියෙනවා. මේ අතිකාල ගඟක මුහුදක දැම්මා වගේ දානකොට, ඒ සීමාව තුළ දුන්නනම්, ඒක නිලධාරීන්ට දොස් කියන්න බැහැ. ඒ ඒ නිලධාරීන්ට කොච්චර අතිකාල

දෙනවද කියලා, සභාවට දාලා, සභාවේ අනුමත කරලා, ඊට පස්සේ ඔවුන්ට අතිකාල දීමනා දෙන්න. මුරකරුවන් යම් ක්‍රමවේදයකට සේවයේ යොදවන්න කියලා මම අපේ ලේකම්තුමියගෙන් ඉල්ලීමක් කරනවා. ඇත්තටම සේවයට අමතරව කරන සේවාවට අතිකාල දිය යුතුයි. ඒක ඔවුන්ගේ අයිතියක්. රාත්‍රී වෙනකන් වැඩ කරන පිරිසකුත් ඉන්නවා. රියදුරන් සඳහා මෙච්චර ප්‍රමාණයක් කාර්යාල කාර්ය සහායකයින් සදහා මෙපමණ ප්‍රමාණයක් ආදී වශයෙන් අතිකාල දීමනා මාසිකව ලබාදෙන්න. එය පාලනයටත් පහසුයි. බොහොම ස්තූතියි.

**ගරු මන්ත්‍රී නිශාන්ත නන්දන මහතා**

තල්ගස්වල අනවසර ඉදි කිරීම් සම්බන්ධව කතා කළා. මීට අවුරුදු දෙකකට ඉස්සර ඔය අනවසර ඉදිකිරීම් සඳහා ගඩොල් බැඳීම සිදු වන විට, මේ සභාපතිතුමාට කිව්වට සත පහකට ගණන් ගත්තේ නැහැ. අද එතන අනතුරු තියෙනවා කියනවා. අම්බලම කියලා පෙත්සම් එනවා. මෙතන ඉන්න එක මන්ත්‍රීවරයෙක් එම මාළු කඩය කඩන්න මම කිව්ව කියලා ඒ මාළු වෙළඳාම් කරන පුද්ගලයාට කියලා. ඒ මනුස්සය මාත් එක්ක කතා කරන්නේ නැහැ. ගඩොල් තියලා බදින එක වැරදියි. අපි මේ තත්ත්වයට වැටිලා ඉන්නේ, නීතිය ක්‍රියාත්මක කරගන්න බැරිව. තනිකර බොරුව තියෙන්නෙ. මම මළගෙදරක ගිය විටක, අපි සුසාන භූමියේ වගා කරලා තියෙන්නෙ කියලා සභාපතිතුමාට කිව්වම, කමක් නෑ කිව්වා කියලා මා සමඟ පැවසුවා. බලන්න අනිත් අයට තමයිලු ප්‍රශ්නය තියෙන්නෙ කියලාත් කියනවා. ඌරල සුසාන භූමිය. මම දන්නේ නැහැ ඇත්ත බොරු. නමුත් ඇයි ඇඟ බේරා ගන්නේ. මාසයට දවසයි සභාව තියෙන්නේ. එදාට සභාවෙ ඉන්න ඕන. දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටුව තියෙනවා කියනවා. මළගෙයක් තියෙනවා කියනවා. මේ ක්‍රමය වැරදියි. මාසයට එක දවසයි මහජන ප්‍රශ්න අරගෙන, අපට එන්න තියෙන්නෙ. එදාටත් ඒවට විසඳුම් ගන්න සභාපති නැත්නම් වැඩක් නැහැ. ඒ වගේම මාපලගම පිට්ටනිය ගැන කතාකළා. වේදිකාව හදනවා. ඊට ඉදිරිපිටින් වොලිබෝල් කොඩ් එක හදනවා. හරි අපරාධයක් කරන්නෙ උප සභාපතිතුමනි, මොකද ඒනිසා වේදිකාව වැහෙනවා.

ළමා පිට්ටනිය හදනවා. අපරාදෙ ඒක හදන්න අව් රස්නය නොවැටෙන ස්ථාන තිබුණා. හදපු මිනිස්සු දන්නෑ වොලිබෝල් කෝඩ් එක ගන්නෙ කොයි පැත්තෙන්ද කියලා. සෙල්ලම් කරනකොට හිරු එළිය කොයි පැත්තටද වැටෙන්නේ. ඒව මොනවත් දන්නේ නැහැ. ඒ ගැන විමසුවම, කියන්නේ, පාරට ජේන්න ඕන නිසා කියලා. නමුත් කරන්න ඕන මන්ත්‍රීවරයෙක් කියන දේ නෙවෙයි. හරි දේ තමයි කරන්න ඕන. අර බෝධිය ලොකු වෙන්න කලින්, 10 සැරයකට වැඩිය කිව්වා. බෝධිය අයින් කරන්න කියලා, නමුත් කළේ නැහැ. ව්‍යාපාරික ප්‍රජාව දැන් පිළිමයකුත් තියලා. මොකද පාර පුළුල් කළොත් කඩ පේළිය කැඩෙයි කියන බයට, දැන් හදන්න බැහැ. මේවා වෙනකම් බලන් ඉන්නවා. මාළු කඩය ඇති ස්ථානය හරිම වැරදියි. පාකින් කියන තැන නැති වුනහම, නගරයක් දියුණු වෙන්නේ නැහැ. නාගොඩ යටලමත්ත දියුණු වෙන්නෙ නැත්තෙ ඒකයි. පාකින් නැති නිසා. ඒ වෙනුවට කඩකාමර වැඩි වෙලා. විශේෂයෙන් උප සභාපතිතුමා ඔබතුමා ක්‍රීඩකයෙක්. බලන්න වාලිබෝල් කෝඩ් එක නිවැරදි පැත්තෙ හදන්න, දැන්වත් අවධානය යොමු කරන්න. සියලු දෙනාටම ලැබුවා වූ නව වසර සුභ වෙන්න කියා පාර්ථනා කරමින්, මම නිහඬ වෙනවා. බොහොම ස්තූතියි.

**ගරු උප සභාපතිතුමාගේ මූලාසන කතාව**

ගරු මන්ත්‍රීවරුනි, රැවුළයි කැඳයි දෙකම බේරගෙන අද මූලාසනයට ඇවිල්ලා, සභාවේ කටයුතු අවසන් කරන්න, මූලාසන කථාව කිරීමටයි බලාපොරොත්තු වෙන්නේ. සභාවේ සිදුවුණු සිදුවීම්

පිළිබඳව මගේ  සටහනක් නැහැ. සභාපතිතුමා පොඩි සටහනක් තියලා තියෙනවා. ගරු මන්ත්‍රීතුමන්ලා, යටලමත්ත වොලිබෝල් ක්‍රීඩා පිටියේ ඉදිරියේදී කටයුතු කරන බව මමත් දන්නවා. එතන තිබුණෙ පුද්ගලිකව පස් කපලා, පස් විකුණාවි කියන ප්‍රශ්නය. බැලුවම, වොලිබෝල් ක්‍රීඩා පිටියකට නොගැලපෙන ස්ථානයක් තමයි. නමුත් ඕනම කන්දක් තුනී කරලා, වොලිබෝල් ක්‍රීඩා පිටියට, දිග මීටර් 30යි  පළල මීටර් 20 තියෙද්දි කරන්න පුළුවන්. නමුත්ඒ දේ කරන්න. මුදල් හොයාගන්න වෙනවා.

ඒ වගේම පියල් මන්ත්‍රීතුමාගේ ජල යෝජනා ක්‍රම ලිපි ලැබුණා. එතුමා දේශපාලන භේදයකින් තොරව, කොට්ඨාශයේ විවිධ පක්ෂ නියෝජනය කරන අය ඉන්නවා. කණ්ඩායම් ඉන්නවා. ඒ අයටත් ආරාධනා කරනවා. සාමූහිකව ජල ව්‍යාපෘතියට සම්බන්ධ වෙන්න කියලා. වනිගරත්න මහත්තයාගේ සමිති ශාලාව සම්බන්ධව සඳහනක් කරලා තියෙනවා. ඒ වගේම මම සඳහන් කළ හඟරන්වල මාර්ගයේ කණ්ඩිය කඩා යාම පිළිබඳව සඳහනක් තියෙනවා. උඩලමත්ත දකුණ ක්‍රීඩා පිටිය පිළිබඳ මන්ත්‍රීවරු විවිධ අදහස් දැක්වුවා. ඒකට ලක්ෂ තුනහමාරක ප්‍රතිපාදන වෙන් කරලා, ඒකෙ මුදල් නැවත ගිහිපු බවක් සඳහන් වුණේ නැහැ. මම හිතන්නේ ඉසුරු දොඩංගොඩ මහතාගෙන් ලක්ෂ 10 ක මුදලක් වෙන් කරලා වෙන්න ඇති. ඒ ක්‍රීඩා පිටිය කරල දෙන බවට එතුමා සඳහන් කළා. නමුත් සභාවෙන් ඉතුරු ටික කරයි කියලා එතුමාගේ බලාපොරොත්තුවක් තිබුණා. එය සිදු වුණේ නැහැ. මමත් සමාරම්භක උත්සවයට ගියා. ඒ ක්‍රීඩකයන්ට අපි පොරොන්දුවක් වුණ නිසා මේ දේ කරල දෙන්නම් කියලා, අපටත් පොඩි ලැජ්ජාවක් තියෙනවා. මම සොයා බලන්නම්.

ජයවීර මන්ත්‍රීතුමා සඳහන් කල ලිපි හා පෙත්සම් දෙක කියෙව්වා. අදාල මාර්ග අපට ද අයිති? එහෙම නැත්නම් පළාත් මාර්ග ද යන්න පිළිබඳව ගැටලුවක් පවතිනවා. සමහර වෙලාවට මධ්‍යම ආණ්ඩුව කඩ ඉවත් කරලා තියෙනවා. මෙහි නමක් ගමක් සඳහන් කර නොමැති නිසා මෙය ප්‍රතික්ෂේප කරන්නත් තිබුණා. සභාපතිතුමාට බලය තියෙනවා කියවලා, බලලා මෙය ඉවත් කිරීමේ හැකියාව. නමුත් එතුමා සභාවට ඉදිරිපත් කළ යුතු යෝජනාවක් නිසා තමයි. ඒ පිළිබඳව අද දැනුම් දීමක් කළේ.

ඊළඟට වෙනත් කරුණු යටතේ, ගරු මන්ත්‍රීතුමන්ලා අදහස් කරල කතා කරපු කරුණු, සංවර්ධනය පිළිබඳව, ආණ්ඩුව පිළිබඳව, ආණ්ඩුවේ ක්‍රියාකලාපය පිළිබඳව. ඒ දේවල් ගැන තමා ගොඩක් කතා කළේ. මම බාධා කළේ නැහැ. නමුත් මම මතක් කරනවා. ගරු මන්ත්‍රීතුමන්ලා ට එවපු න්‍යාය පත්‍රය සමඟ සභා රීති පිළිබඳව ගරු සභාපතිතුමා සඳහනක් කරලා එවලා තිබුණා. ඒ පිළිබඳව අධ්‍යනය කරලා, සභාවේ නීති රීති වලට අනුව, සභාවේ රීති අනුව යෝජනා ගේනවා නම් තමයි හොඳ.

ඒ වගේම අයාලේ යන සුනඛයන් පිළිබඳව කතා කළා. ඇත්තටම මේවා හොඳ යෝජනා. පිස්සු බල්ලන්ගෙන් වන හානිය පිළිබඳව සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී කාර්යාලයට කතා කරලා, අවශ්‍ය කටයුතු කරයි කියලා, අපි බලාපොරොත්තු වෙනවා.

ගරු චන්ද්‍ර සහබන්දු මැතිතුමා කොම්පෝස්ට් වල ප්‍රගතිය පිළිබඳව වාචික ඉල්ලීමක් කලා. එය ලිඛිතව ඉල්ලුව නම් හොඳයි. ඒ වුණත් කමක් නැහැ. මම ලේකම්තුමියට කියනවා ඒ පිළිබඳව ලබන සභාවට මුදල් අතිරික්තයක් තියෙනවද, ලාභ අලාභ පිළිබඳව සාකච්ඡා කරන්න පුළුවන් වාර්තාවක් දෙන්න කියලා, මම ලේකම්තුමිය ට නියෝග කර ප්‍රකාශ කර සිටිනවා.

තව අපේ  ලක්රුවන් මන්ත්‍රීතුමා වෙනත් කරුණු යටතේ කතා කරද්දී, පාරවල් පවරා ගැනීම සම්බන්ධව දීර්ඝ වශයෙන් කතා කළා. මගේ ආරම්භයේදීම ඔළුවේ තිබුණු කරුණක් මේක. ඊයෙ පෙරේදත් මඤ්ඤොක්කාහේන මාර්ගයේ වැටවල් ගහගන්නවා, ගුටි ඇන ගන්නවා, පොලීසි යනවා, කූඩුවේ ඉන්නවා. සින්නක්කර ඉඩම් වලින් පාරවල් තිබුනත්, එය සංවර්ධනය කිරීමේදී ගැටලු තියෙනවා. ලේකම්තුමාට LRC ඉඩම් සම්බන්ධව නම් ගැටලුවක් විසඳ ගන්න පුළුවන්. ඒ අනුව මම ලේකම්තුමියට මතක් කර සිටිනවා. එතුමියට නියෝග කර සිටිනවා. යෝජනා කරපු පාරවල්

පිළිබඳව, පලවෙනි සභාවේ සිට පාරවල් පවරා ගැනීම සම්බන්ධව යම් මන්ත්‍රීවරියක් හෝ මන්ත්‍රීවරයෙක් ඉල්ලීම් කරල තිබෙනවා නම්, ඒ ඉල්ලීම් කරපු යෝජනාව, මොන මාසේ ද ඇතුළත් කළේ කියලා වාර්තාවක් සකස් කරල දෙන්න කියලා. ගරු සභාපතිතුමාවත් උනන්දු කර ගෙන, අපිත් එකතුවෙලා, තව අවුරුද්දකින් දීර්ඝ කරලා තියෙන්නේ, ඒ කාලය තුළවත් මෙහි ඉදිරි කටයුතු කරන්න අපි වග බලා ගමු. වර්තමානයේ පාරක් පවරා ගන්නවා නම්, මම ඔබතුමාලට කියන්න කැමතියි එම මාර්ග පවරා ගැනීමේදී අඩි 14- 21 ඉල්ලන්න යන්න එපා. එහෙම වුනොත් ගැටලු. ඕව ගෙවල ඕන ගන්න. තමන්ගේ අඩි 6 තියෙන පාර 8 කරගන්න, 8 තියෙන පාර අඩි 12 කරගන්න, දාහතර දාසය කරගන්න. එවැනි පොඩි එකක් තිබුණම, අපිට පුළුවන් නෝට් එකක් දාලා, පාර පවරා ගැනීමේ කටයුතු කරන්න. අතින් අත යන්නෙ නැතිව, ලබන මාසේ වන විට අපි අවසන් කරමු. ඒ න්‍යායපත්‍රයටම දින හතකට කලින් ඇතුලත් කරලා, යෝජනා ස්ථිර කරගෙන, මේ වැඩේ මෙතනින් ආරම්භ කරන්න කියලා අපි මන්ත්‍රීතුමාලගෙන් ඉල්ලා සිටිනවා.

අතිකාල දීමනා සම්බන්ධයෙන් දීර්ඝ වශයෙන් සාකච්ඡා වුණා. අපි මේ සේවය කරන ස්ථිර හා තාවකාලික සේවක මහත්තරුන්ට අගෞරවයක් නොවෙයි කරන්නෙ. ඒ පිළිබඳව කරන ගෙවීම් සීමා වෙන්න ඕන. එහෙම නොවුණොත් අතිවිශාල මුදලක් අතිකාල දීමනා වෙනුවෙන් ගෙවන්න සිදුවෙනවා. එසේ නොකර කටයුතු කළොත්, වෙන සංවර්ධන කාර්යයක් කරන්න වෙන්නේ නැහැ. මම හිතන්නේ අතිකාල සීමා කරගෙන, අවශ්‍ය වෙලාවක පමණක්, ඒ කම්කරුවන්ට, තාවකාලිකව කටයුතු කරන අයට දීලා, මෙය පාලනය කරගන්න කටයුතු කරගන්න ඕන. මෙය ප්‍රශ්නයක් නොවෙන්න, මේවා අපි පුද්ගලිකව, අපි නිලධාරී මහත්වරුන් දැනුවත් වෙලා, කටයුතු කරන්න ඕන කරුණු කාරණා.

ආණ්ඩුවට විවිධ චෝදනා කළා. මේ සම්බන්ධව මුලාසනයෙන් බලන්න ඕන. නැවතත් මෙම අපහසුතා වෙන්න දෙන්නෙ නැහැ. වසරක කාලයක් මෙම සභාව දීර්ඝ කලේ, මැතිවරණය තියාගෙන ද දන්නෙ නැහැ. නමුත් යම් වැඩපිළිවෙළක් තියෙනවා. අපේ කොට්ඨාසවල පොදු මහජනතාවට මෙම ප්‍රතිලාභ භුක්ති විඳීමට හැකි වේවි. ඒ වගේම ආර්ථික දුෂ්කරතා නැති කරන්න , ගමේ ප්‍රධානීන් මූලික කරගෙන කමිටුවක් හරහා තමයි මේ දේවල් සිද්ධ වෙන්නේ කාර්තු තුනකට බෙදලා දේශපාලන වෙනස්වීම් කරන්න වැඩපිළිවෙළක් තියෙනවා.

නායකත්වයට අපි කිව්වා මේ පොහොර ප්‍රශ්නය සම්බන්ධව. එතුමා එයට නිසි පියවරක් ගන්නැත්නම් මහජනතාව වෙනුවෙන් අපටත් යමක් කරන්න වෙනවා.

ඒ වගේම අපේ ප්‍රදේශවල සිටින පොදු මහජනතාවට ,අපි දැනෙන්න ආර්ථිකයට යමක් කරන බවත් දන්වමින්, සියලු ප්‍රශ්න වලට ඉදිරියේදී විසඳුම් ලබාදීමට කටයුතු කරන බව පවසමින්, ඔබටත් සුබ අනාගතයක් ප්‍රාර්ථනා කරමින්, ලබන මාසයේ දී නැවත මෙවැනි සභාවේ හමු වීමට බලාපොරොත්තුවෙන්, සියලු දෙනාටම විසිර යාම සඳහා අවසර ලබා දෙනවා. බොහොම ස්තූතියි.

**සභා වාර්තාව ස්ථිර කිරීම පිළිබඳ ගරු සභාපතිතුමාගේ ප්‍රකාශය**

2022.01.11 දින පවත්වන ලද සභා වාරයේ රැස්වීම් වාර්තාවේ විරෝධතා නිවැරදිකිරීම් වලට යටත්ව සම්මත කරන ලද බව ගරු සභාපතිතුමා විසින් පිළිගන්නා ලදී.

සභාපති,
නාගොඩ ප්‍රාදේශීය සභා රැස්වීම් ශාලාවේදී දිනය:-